# Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2025), Vol. 10 (02)


# An Investigative Study of The Rituals and Offerings of the Ilmaha Maṁgalyaya at the Ruhuṇu Mahā Kataragama Dēvālaya


R. M. P. S. Weerasooriya[1*] and W. V. P. H. Ranaweera[2,3]

[1]Faculty of Graduate Studies, University of Sri Jayewardenepura, Sri Lanka, [2]International Center for Multidisciplinary Studies, [3]Department of Languages, Cultural Studies and Performing Arts, University of Sri Jayewardenepura, Sri Lanka



**Article Info**

Article History:
Received 08 Aug 2024
Accepted 18 Nov 2025
Issue Published Online
01 July 2025

**Key Words:**
Ilmaha Maṁgalya procession
Duites at Kataragama Dēwalaya
Tamil Culture



*Corresponding author
E-mail address:
prasad.weerasooriya1@gmail.com

https://orcid.org/0009-0001-2027-950X



Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v10i02.13

VJHSS (2025), Vol. 10 (02), pp. 182-194

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)



©Faculty of Humanities and Social Sciences 2025



## ABSTRACT

*Ruhuṇu Mahā Kataragama Dēvālaya is one of the renowned religious places, where the lord Skanda is worshiped in Sri Lanka. Ceremonies and rituals at this location follow long-established traditional customs, among which the annual Ilmaha Maṁgalyaya stands out as a significant ceremonial event. The research problem focused on identifying whether the Ilmaha Maṁgalyaya encompasses any distinctive ritualistic traditions. The primary objective of this research was to examine the significance of the rituals and offerings of the Ilmahā Maṁgalyaya and to explore the priestly lineages associated with them. The study also aimed to identify the distinctive characteristics of the Ilmaha Maṁgalyaya in comparison with similar practices. The conclusion was made by thematic analysis of qualitative data gathered through interviews and direct observations under field studying. Ancestral priests, women involved in the rituals (Ālatti ammāvaru), and relevant officials contributed valuable insights through interviews. The Kataragama Ilmaha Maṁgalyaya is conducted with particular emphasis on the Perahera (procession) ceremony. In keeping with tradition, all rituals are performed by eighteen appointed members of a committee, each entrusted with specific duties in accordance with the indigenous customs. At the commencement of the procession, lamps are lit at the Valli Ammā Dēvalaya to signify its role within the ritual proceedings. In addition, distinctive traditions and customs are observed, such as adherence to the auspicious rituals(kæti nækata), floating the discarded materials of Dēvalaya at Diya Mudun Thota, playing rhythmic beats as the procession returns, and lighting lamps. These practices are unique to this Ilmaha Maṁgalyaya and distinguish it from similar ceremonies. The study revealed that these traditions, which embody both Sinhala and Tamil cultural elements, are uniquely endemic to the Ruhunu Mahā Kataragama Dēvalaya.*

**මාතෘකාව**

රුහුණු කතරගම දේවාලයේ ඉල්මහ මංගල්‍යය චාරිත්‍ර සහ පුද පූජා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

## 1. හැඳින්වීම

විවිධ ජන සංස්කෘතීන්ට ආවේණික ආගමික පුද සිරිත් හා චාරිත්‍ර පවතී. ඒවා අදාළ ජන සමාජයේ පිළිගත් පුද්ගල සම්මුති හා විශ්වාස මත ගොඩනැගුණු ඒවා වේ. ප්‍රධාන ආගම් කිහිපයකින් සැදුම්ලත් ශ්‍රී ලාංකේය සංස්කෘතියෙහි ආගමික පුද සිරිත් අතර දේව වන්දනයට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. ශ්‍රී ලංකා වාසී හින්දු ජනතාව මෙන් ම බෞද්ධ ජනයා ද විවිධ දෙවිවරු අදහති. හින්දුවරු මහා සාම්ප්‍රදායික ඇදහීමක් වශයෙන් දේව වන්දනයෙහි යෙදෙන අතර සිංහල බෞද්ධයා චූළ සාම්ප්‍රදායික ඇදහීමක් වශයෙන් ජන ආගම තුළ දෙවිවරු වන්දනය කරති. ද්‍රවිඩ බසින් 'කෝවිල්' හෝ 'කෝයිල්' යනු දෙවියන් වැඩ සිටින ස්ථානය යි (Kulendiren,2012). ඓතිහාසික විකාසනයක් සහිත ව පුරාණෝක්ති හා බැඳුණු එසේ ම සිංහල හා දමිළ බැතිමතුන් පොදුවේ සහභාගී වන ආගමික ස්ථාන 'දේවාලය' ලෙසත්, පසුකාලීන ව ද්‍රවිඩ ජනතාව අරමුණු කොට ස්ථාපිත වූ ආගමික ස්ථාන 'කෝවිල්' ලෙසත් ජන ව්‍යවහාරයක් පවතී (රණවීර, 2020). සිංහල ජන ආගමත් හින්දු මහා සම්ප්‍රදායත් එකට එක් වෙමින් දේවාලය නමින් හඳුන්වන ආගමික සිද්ධස්ථාන තුළ පවත්වන පුද පූජා විධි සිංහලයා අතර බහුල ය.

බුදු දහමෙහි ආගමනයත් සමඟ ලක්දිව පැවති ඇදහිලි විශ්වාස හා භාරතීය පුද පූජා මෙන්ම විශ්වාස ද එකතු කර ගනිමින් බුද්ධාගමේ ආමිසය වර්ධනය වීමෙන් ලංකාවේ ජන ආගම සකස් විය (රත්නපාල, 1995). බොහෝ විට හින්දු ආගමේ එන ඇතැම් දෙවි දේවතාවුන් ලාංකේය ජන ආගමට එක් වූ අතර ඇතැම් දෙවි දේවතාවුන් ජන ආගමට එක් නොවී හින්දු සම්භවය සහිත ව ම වන්දනයට ලක් වන බව පෙනේ. හින්දු මෙන් ම බෞද්ධ ජනතාව විසින් ද පොදුවේ අදහනු ලබන දෙවි කෙනකු ලෙස කතරගම දෙවියන්ට ලාංකේය සමාජයෙහි හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. හින්දු ආගමික සම්භවයක් සහිත ව මෙන් ම සිංහල ජන ආගමේ දෙවි කෙනකු වශයෙන් ද ලාංකේය සමාජය තුළ කතරගම දෙවි පුද ලබයි.

කතරගම දේව විශ්වාස පිළිබඳ ජනශ්‍රැතිවලට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. දේශීය වශයෙන් ව්‍යාප්ත වූ කතරගම දේව සංකල්පය හා භාරතීය ස්කන්ද කුමාර සංකල්පය අන්‍යෝන්‍ය වශයෙන් බද්ධ ව නිර්මාණය වී ඇත. පොළොන්නරු යුගයේ සිට ඇති වූ හින්දු බලපෑම පසුකාලීන ව ක්‍රමයෙන් වර්ධනය වී චෝළ ආක්‍රමණ සමඟ දියුණු වී කෝට්ටේ යුගයේ දී ද්‍රවිඩ අධිපතීන් විසින් වර්ධනය කර නුවර යුගයේ දී උපරිමයට පත් විය. නුවර යුගයේ දී සතරවරම් දෙවියන් අතරට එක් වෙමින් පුද ලැබූ කතරගම දෙවි, කෝට්ටේ යුගයේ දී එතරම් සුවිශේෂ කොට සැලකූ දේව සංකල්පයක් නොවී ය. කෝට්ටේ යුගයේ දී එය වඩාත් ජනප්‍රියත්වයට පත් ව තිබුණේ ස්කන්ද කුමාර සංකල්පය ලෙසිනි (රත්නපාල, 1995).

කජරගම, කදරගම, කාචරගාම, කදරගම යනුවෙන් විවිධ නම්වලින් හඳුන්වන වර්තමාන කතරගම සිද්ධස්ථානය ශ්‍රී ලාංකේය ජනතාව කතරගම දේව වන්දනයේ යෙදෙන ප්‍රධානතම පුද බිම යි. ඌව පළාතේ මැණික් ගං ඉවුරට යාබදව පිහිටා ඇති මෙම දෙවොලට ඇතුළු වීම සඳහා සතර දිශාවෙන් ද්වාර සතරක් ඇත. විශේෂයෙන් බෞද්ධ ජනතාවගේ වැදගත් පූජනීය ස්ථානයක් වන කිරි වෙහෙර, අෂ්ට ඵල බෝධිය මෙන් ම අන්‍යාගමික පූජා ස්ථාන කිහිපයක් ද මෙම භූමියෙහි ස්ථාපිත ව ඇත.

ලාංකේය ජනවර්ග තුනකට පොදු වූ ආගමික පුද බිමක් ලෙස කතරගම පුද බිම ලාංකේය ආගමික සංස්කෘතිය තුළ සුවිශේෂ වූවකි. පුද්ගල ලෞකික අපේක්ෂා සාධනය කොට ගනිමින් ආශීර්වාදය ලබා ගැනීමට සිංහල, ද්‍රවිඩ මෙන් ම මුස්ලිම් ජනතාව ද වසරේ වැඩි කාලයක් කතරගම පුද බිම වැඳ පුදා ගැනීම මෙම භූමියෙහි විශේෂත්වය යි. බෞද්ධ හා හින්දු සංස්කෘති ද්විත්වයට ම අදාළ පුද පූජා විධි දේවාල භූමිය තුළ අවශේෂ ව සිදු කෙරේ.

කතරගම දෙවි හෝ කඳ සුරිඳු නමින් ලාංකේය සමාජයෙහි ප්‍රකට දෙවිගේ භෞතික රූප ස්වභාවය, මුහුණු සයක් හා අත් දොළසක් ඇති දෙවියකු ලෙසින් දේශීය සාහිත්‍ය මූලාශ්‍රය හා ජනශ්‍රැතීන්හි වර්ණිතව ඇත. කතරගම දෙවිඳුන්ගේ බලවත් හීය, රාවණ සංහාරයෙහි යොදා ගැනුණු බව කඳකුමර සිරිතෙහි සඳහන් වේ.

*තානු තරුණ අරුණ කිරණ බරණින් සැදි*
*තේජනේ*
*බානු අසුර අසුරන් යුද ඔද වැඩි ගිරි*
*රාජනේ*
*මුහුණු සයකි අත් දොළොසකි මයුරා පිට*
*වාහනේ*
*රුහුණු රටේ පිහිටි කන්ද කදිර දේව*
*රාජනේ*

*සිද්ද රන්දුනු තදව ගනිමින් එරන් හීයක්*
*අරගෙනා*
*සද්ද වූ ලෙස නෙගොස කරවා මඟුල් පෙරහැරයෙන්*
*යනා*
*යුද්ද වන් කඳ රොසින් දසහිස් රාවණා බිඳ කඳ*
*ගෙනා*
*ඇද්ද තව මට වෙනින් පිහිටක් කතරගම සුරිඳුන්*
*විනා* (බණ්ඩා, 1993, පි. 21*).*

මහාසේන, ස්කන්ද කුමාර, කන්දසාමි, ශ්‍රී මුරුගන්, ශ්‍රී සුබ්‍රමනියම්, ශ්‍රී වේලන්, ආදී නම් වලින් හඳුන්වන කතරගම දෙවිඳුන්ගේ ප්‍රභවය පිළිබඳ විවිධ ජනශ්‍රැති හා ඓතිහාසික පුවත් රාශියකි. මෙම ඓතිහාසික පුවත් හා මතවාද සිංහල හා හින්දු ලෙස කොටස් දෙකකට වර්ගීකරණය වේ. බෞද්ධ පුරාවෘත්ත, සාහිත්‍ය කෘති හා ලේඛනයන්හි සඳහන් වන්නේ කතරගම දෙවියන් ලංකාව පාලනය කරන දෙවිවරු සතර දෙනාගෙන් එක් අයෙකු බව ය (මාලිමගේ,

2007). කතරගම ප්‍රදේශයේ බලය පතුරවා සුරපද්මන් හා පද්ම අසුරයන් වාසය කළ බවත් අසුරයන්ගෙන් නිතර සුරයන්ට කරදර සිදු වූ නිසා සුරයෝ ඉන්දියාවට ගොස් මහා දේව සභාවට සැල කළෝ යැයි ද ඒ අනුව වීරබාහු දේව සමඟ ස්කන්ද කුමරු ලංකාවට පැමිණි බවට ද මතයක් ඇත. එලෙස පැමිණ ඔකඳ ප්‍රදේශය පසු කරමින් කතරගමට පැමිණ අසුරයන් පරාජය කර සුරයන්ට ජය අත්කර දුන් නිසා දේව කණ්ඩායම ස්කන්ද කුමරුට උපහාර ලබා දීමෙන් පසු වැඩසිටි කන්දේ නතර කරන ලදි. එදා පටන් වැඩසිටි කන්දේ වැඩ වසමින් භාවනා කළ ස්කන්ද කුමාරයා උත්තරීතර තත්ත්වයට හෙවත් 'විශ්ව තත්ත්වම්' බවට පත් වී ජනතාවට ස්කන්ද කුමරුගේ තෙද බල හා කරුණාව දක්වනු ලැබේ (රණසිංහ, 2011). එසේ ම ආදිවාසීන්ගෙන් පුද පඬුරු හා තුටු පඬුරු ලබමින් කප්පරකන්ද නදිය ආශ්‍රිත ව පුද ලැබූ මහාසේන හෙවත් මහාඝෝෂ දෙවියන්ට පසු කලෙක හින්දු දේව සංකල්පය ආරෝපණය වූ බව කතරගම දේව උත්පත්තිය සම්බන්ධ තවත් මතයකි. ක්‍රි. පූ 06 වන සියවසේ දී කතරගම නායකයකු ලෙස ජීවත් වූ මහාඝෝෂ හෙවත් මහාසේන පසු කලෙක දී ප්‍රදේශවාසීන් විසින් කතරගම දෙවියන් හැටියට දේවත්වයට නගා ඔහු ජීවත් වූ මාලිගාවට පුද සත්කාර කරනු ලැබී ය. සොළී ආක්‍රමණ යටතේ හින්දු දේව සංකල්ප හා හින්දු දර්ශනය මෙරටෙහි ප්‍රබල ලෙස ව්‍යාප්ත වූ අතර ඒ අනුව කතරගම දෙවියන් ලෙස පුද සත්කාර ලබමින් සිටි රෝහණයෙහි ප්‍රසිද්ධ ව සිටි දේශීය දෙවියන්ට හින්දු දේවත්වය ආරෝපණය විය (රණසිංහ, 2011). ස්කන්ද කුමාර හෙවත් කාර්තිකේය දෙවි පිළිබඳ ව ඇති හින්දු පුරාණෝක්ති රැසකි. කුමාර, කාර්තික, ශන්මුග, සුබ්‍රමනියම් හා මුරුගන් වැනි නම්වලින් හින්දු බැතිමතුන් විසින් මෙම දෙවි හඳුන්වයි. ස්කන්ද යනු ශිව දෙවියන්ගේ හා පාර්වතී දේවියගේ දෙවන පුත්‍රයා ය. ඔහු යුද්ධාධිගෘහිත දෙවියකු සේ සැලකේ.

දෙවියනට අපමණ වධ හිංසා පැමිණවූ තාරක නම් අසුරයා පරාජය කරනු පිණිස ශිව දෙවි හා පාර්වතිය දේවියගේ සංයෝගයෙන් උපන් දරුවකු සේ ශිව පුරාණයෙහි රුද්‍ර සංහිතාවෙහි 4 වන ඛණ්ඩයට අයත් කුමාර ඛණ්ඩයෙහි ස්කන්ද කුමාර දෙවියන් දක්වා ඇත (The Śiva-purāṇa Part I, 1950). එහි වැඩි දුරටත් දැක්වෙන්නේ ශිව දෙවියන්ගේ දරුවකු ලෙසින් ගංගා නදිය මත දරුවා බිහි වූ බවත්, කාන්තාවන් හය දෙනකු විසින් දරුවාව පෝෂණය කළ බවත් ය. ගංගා නදියෙන් බිහි වූ ශිවගේ පුත්‍රයාගේ පුවත සුළු වෙනස්කම් සහිත ව ස්කන්ද පුරාණයෙහි ද දැක්වේ. ස්කන්ද පුරාණයෙහි මහේශ්වර ඛණ්ඩයෙහි පළමු කොටස වන කේදාර ඛණ්ඩයෙහි සඳහන් වන අන්දමට මහා බලසම්පන්න කුමාර කාර්තික දෙවි ගංගා ඉවුරේ උපත ලද ලැබී ය. මුහුණු සයක් සහිත වූ නිසා ශන්මුඛ නම් විය. මෙම උපත සමරනු වස් කෛලාස කූටය මල් සහ කොඩිවලින් සැරසූ අතර මුළු පර්වතය ම ජය ඝෝෂාවලින් පිරී යන ලදි. සුර, ඍෂි, ගාන්ධර්ව, යක්ෂ ආදි සියලු දෙනා ස්කන්ද කුමරු (ගංගාගේ පුත්‍රයා) දැකීමට ගියහ. එසේ ම ඇතැමෙක් නැටුම්වල නිරත වූහ. තවකෙක් සංගීත භාණ්ඩ වාදනය කළේය. මෙම දරුවා ඉතා දීප්තිමත් වූ අතර මුහුණ තේජාන්විත විය (The Śkanda-purāṇa Part I, 1950). භස්මාසුර හා ඊශ්වර දැහැන සම්බන්ධ කථා ප්‍රවෘත්තියක් ද ස්කන්ද කුමාරගේ උපත සම්බන්ධ ව ඇත (Obeyesekere, 1984)' හින්දු සාහිත්‍යයට අනුව ස්කන්ද කුමාර, ගණේෂ හෙවත් ගණ දෙවියන්ගේ බාල සහෝදරයා ය (The Śiva-purāṇa, 1950). මෙම දෙවියන් වෙනුවෙන් දකුණු ඉන්දියානු ජනතාව වාර්ෂික උත්සව පවත්වන අතර සුළඟට අධිපති වායු ලෙස ද, ජලයට අධිපති වරුණ ලෙස ද, පරිසරයට අධිපති මුරුගන් ලෙසට ද නම්කර ඇත (අබේනායක, 2021). වේ. ස්කන්ද දෙවියන්ගේ බ්‍රහ්මණ ස්වරූපය පිළිබඳ ව දකුණු ඉන්දියාවේ ප්‍රචලිත ව ඇති අතර තෙවන ශතවර්ෂයේ දී බ්‍රහ්මණ ආගම හා ස්කන්ද වන්දනය දැඩි ලෙස තිබූ අතර ඒ සඳහා මහාසේන නමැත්තෙකු අනුග්‍රහය දක්වා ඇතිබව ද වාර්තා වේ (Sircar, 2001). කෙසේ වෙතත් කඳ කුමරු යන්න ස්කන්ද කුමාර යන භාරතීය සංකල්පයට වඩා කන්දේ දෙවියෝ යන ලාංකික සංකල්පයට සමීප ව අර්ථ කරගත යුතු බව නන්දසේන රත්නපාලගේ අදහස යි (රත්නපාල, 1995).

කාර්තිකේය හෙවත් මුරුගන් දෙවි සඳහා දිවයින පුරා හින්දු කෝවිල් රාශියක් ඉදි ව පවතී. සාම්ප්‍රදායික හින්දු වතාවත් ඒවායෙහි සිදු කෙරේ. සිංහල ජන ආගමෙන් නිෂ්පන්න වූ ඇදහීමක් ලෙස බෞද්ධ විහාරස්ථානවල ද කතරගම දේවාලය සුලබ ය. එම කුඩා දේවාලය පසුබිම් කොට ගන්නේ හින්දු ස්කන්ද කුමාර සංකල්පයට වඩා දේශීය වශයෙන් ප්‍රකට ව පවතින කතරගම කේන්ද්‍ර කොට ගත් මහා කතරගම දේවාලය සහ ඒ හා බැඳි වතාවත් හා පුද පූජා ක්‍රම යි. හින්දු පුද පූජා නොව දේශීයත්වයට පත් වූ උත්සව, දේව කන්නලව් හා පුද පූජා විධි ඒවායෙහි ප්‍රමුඛ වේ. සිංහල ජනතාව විසින් කතරගම දෙවි වන්දනය සඳහා දේශීයත්වයට නැගූ ගාථා යොදාගනු ලැබේ.

*කදිරනෙ දෙව ගොවින්දං - පාලෙතු ලොක ශාසනං*
*එතෙ දෙවානුභාවෙන - කඳසවාමි නමො වරං*
*ස්කන්ධං සන්මුඛම් - මයූරසොභාපනිෂ්ඨිතං*
*පූජයිම් මහාශෛනාං - පාතුමාං කෘපයා සදා*
*(මාලිමගේ, 2000, පි. 159).*

කතරගම පුදබිමෙහි ස්ථානගත වන කතරගම මහා දේවාලය හා අවශේෂ දේවාල වල හින්දු මෙන් ම සිංහල බෞද්ධ සංස්කෘතික ලක්ෂණ කැටි කොට ගැනීම විශේෂත්වයකි.

උත්සව හා පුද පූජා යනු කිසියම් ආගමක චිර පැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය අංගයකි. මිනිසුන් ආගමික ක්‍රියාකාරකම් වෙත ඇද බැඳ තබා ගැනීම

සඳහා උත්සව හා පුද පූජා අත්‍යවශ්‍ය වේ. කතරගම මහා දේවාලයෙහි ද මෙම දේවාලයට ම විශේෂ වූ දෛනික හා මාසික උත්සව මෙන් ම වාර්ෂික උත්සව මංගල්‍යය ද ඇත. කතරගම දේවාලයෙහි විශේෂත්වය වන්නේ මෙම උත්සව සඳහා ජාති භේදයකින් තොරව බැතිමතුන්ගේ සහභාගීත්වයක් සිදු වීම යි. රුහුණු මහා කතරගම දේවාලයෙහි පවත්වන වාර්ෂික උත්සව ඉල්මහ කාර්තික මංගල්‍යය, අලුත් අවුරුදු මංගල්‍යය, ඇසළ මංගල්‍යය හා කණු කැපීමේ මංගල්‍යය ලෙස නාමකරණය වන අතර ඒවාට අදාළ ව පවත්වන පුද පූජා හා චාරිත්‍ර විධි රාශියක් ඇත.

ඉල්මහ මංගල්‍යය, ඉල්මහ කච්චිය, ඉල්මහ කාර්තික, කාර්තික මංගල්‍යය නමින් හැඳින්වෙන උත්සවය රුහුණු මහා කතරගම දේවාලයේ පවත්වන වසරේ අවසාන උත්සවය යි. මෙම උත්සවය සිදු කෙරෙන්නේ ඇසළ උත්සවය නිම වී සිවු මසකට පසු ව එළඹෙන නොවැම්බර් මාසයේ ය. හින්දු සම්ප්‍රදාය අනුව නොවැම්බර් මාසය හැඳින්වෙන්නේ කාර්තික මාසය ලෙසනි. කාර්තිකේය යනු හින්දු සම්ප්‍රදාය අනුව ස්කන්ද කුමාර දෙවියන් ය. ස්කන්ද පුරාණයෙහි මෙම දෙවිඳුන්ගේ උපත සඳහන් වන්නේ "කුමාර කාර්තිකේය උපත" ලෙසිනි (The Śkanda-purāṇa Part I, 1950). කාර්තික මාසයේ පවත්වන කාර්තික උත්සවය හෙවත් ඉල්මහ මංගල්‍යය පැවැත්වීමේ අරමුණ පිළිබඳ ව එකිනෙකට වෙනස් මතවාද ඇත. උත්සවශ්‍රීයෙන් පහන් ආලෝක දැල්වීම මෙම උත්සවයේ විශේෂ අවස්ථාවකි. කතරගම දෙවියන්ගේ ප්‍රඥාව පුද්ගලාරෝපණය කර අන්ධකාරය දුරු කිරීම පහන් ආලෝකය මගින් සංකේතාත්මක ව ඉදිරිපත් කරන බව එවන් මතයකි (Bhaktha, 2016). එය කතරගම දෙවියන්ගේ උපත සමරනු වස් සිදු කරන්නක් බව කතරගම දේවාල කපුමහත්වරුන් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවල දී අනාවරණය විය. සුර අසුර යුද්ධයෙන් ජයග්‍රහණය අත්කර ගනු පිණිස කැති නැකතින් ස්කන්ද කුමරු උපත ලැබීම මින් සැමරෙන අතර ඉන්දියාවේ දී මෙම උත්සවය නපුරු ආත්මයන් දුරු කිරීමේ අපේක්ෂාවෙන් ද සිදු කරයි (Razid, 2024). ස්කන්ද කුමරුගේ උපත සිදු වන්නේ තාරක අසුරයා විනාශ කිරීම සඳහා බව හින්දු සාහිත්‍යයේ දැක්වේ (The Śiva-purāṇa, 1950; The Śkanda-purāṇa Part I, 1950). එසේ ම මාලිමගේ දක්වන පරිදි අසුර සංහාරය සිදු වූයේ ද ඉල්මහ මංගල්‍යය දිනයක දී ය (2000, පි. 160). ශ්‍රී ලංකාවේ ස්කන්ද කුමාර දෙවියන් පුද ලබන කතරගම දේවාලයන්හි ඉල්මහ මංගල්‍ය සිදු කරන විට භාරතයේ තමිල්නාඩුවේ "තිරුවනමලෛයි කන්ද" ආශ්‍රිත ව ද "කාර්තිකේය දීබ(ප)ම්" උත්සවය සිදු කෙරේ. ශිව දෙවියන් අග්නි ස්ථම්භයක ස්වරූපයෙන් ලෝකයට පහළ වීම සිහිපත් කිරීම මෙන් ම සුර අසුර යුද්ධයෙන් ජයග්‍රහණය අත්කර ගනු පිණිස කැති නැකතින් ස්කන්ද කුමාරු උපත ලැබීම ද මෙම උත්සවයෙන් සමරනු ලැබේ (ethictangorearts.com, 2024).

අතීතයේ සිට පවත්වා ඇති මෙම උත්සවය මදනෝත්සවයක් ලෙසට ද ප්‍රසිද්ධ ව තිබූ බව අධ්‍යයනයේ දී අනාවරණය විය. *"කාර්තික උත්සවය මහත් උත්සවාකාරයෙන් පැවැත් වූ තවත් රාජකීයකු නම් ධනංජය රජතුමා ය. රජුන්, දෙවියන් මෙන් ස්වර්ණාභරණයෙන් සැරසී චිත්ත රාජ නමැති යක්ෂයා ඉදිරිපිට සිටගෙන සිවු දිසාවට මල් විදීම මෙහි දී සිදු වූ එක් චාරිත්‍රයකි. මෙය අනංගයාගේ මල් හී සිහි ගන්වයි. කාර්තිකෝත්සවය මදනෝත්සවයක් වූ බව තහවුරු කළ හැක්කේ මේ කරුණු සැලකීමෙනි. බෞද්ධ ජාතක කතා අන්තර්ගතයෙහි ද කාර්තිකේය උත්සවය පිළිබඳ සඳහන් වී ඇත. උන්මදන්තී ජාතකයේ දැක්වෙන විස්තරය අනුව උත්සවය පැවැත්විය යුතු වූයේ ඉල් මාසයේ දී ය"* (සෝරත හිමි, 2009, පි. 125). ප්‍රේමචන්ද්‍ර අල්විස් පරිවර්තනය කළ "නොක්ස් දුටු ලංකාව" කෘතියෙහි ද කාර්තික උත්සවය පිළිබඳ සඳහනක් ඇති අතර මෙය දෙවියන් උදෙසා සිදු කරන ආලෝක පූජාවක් බවත් නොවැම්බර් මාසයේ සිදු කරන බවත් පෙන්වා දී ඇත. *"නොවැම්බර් පුන් පොහෝ දින රාත්‍රියේ කාර්ති පූජා නමින් මහෝත්සවයක් පැවැත්වෙයි. දේවාලය වටා පහන් දැල්වීමත්, කැලයෙන් ලබාගත හැකි උස්තම රිටිවල මුල සිට අගට කිසියම් ක්‍රමයකින් පහන් රඳවා ඒ රිටි දේවාලය අබියස මෙන් ම රජ මාලිගය ඉදිරියෙහි ද හිඳුවීමත් කාර්ති උත්සවයේ දැකිය හැකි එක ම සැරසිල්ල යි. මේ පහන් 'ඇගෑ පෙළ තොරණ' නමින් හැඳින්වෙයි. රිටිවල රැඳ වූ පහන් නිවෙන්නට නොදී රැය පුරා දැල්වීම සඳහා ප්‍රදේශවාසීහු සියලු දෙනා ම දේවාලයට තෙල් පූජා කරති. රජ තෙමේ කාර්ති උත්සවයට ඉමහත් කැමැත්තක් දක්වයි. .............. මේ උලෙළ එක් රැයකින් නිම වෙයි"* (අල්විස්, 2009, පි. 198, 199). අශෝක මාලිමගේ සාහිත්‍ය මූලාශ්‍රය ඊට වෙනස් මත දක්වා ඇත. *''නැකැත් උත්සවයක් වන ඉල් මාසයේ පැවැත්වෙන නිසා ඉල් උත්සවය ලෙස සඳහන් වෙයි. මහා දේවාලය පහන්වලින් ආලෝකවත් කර දින තුනක් මහා දේවාලයත් වල්ලි දේවාලයත් අතර දේව ප්‍රතිමාව රැගත් පෙරහැර පවත්වනු ලැබේ. අසුර සංහාරය සිදු වූයේ ද ඉල්මහ මංගල්‍යය දිනයේ දී ය"* (මාලිමගේ, 2000, පි. 160). මේ පිළිබඳ රචනා වූ ඇතැම් කෘතිවල සඳහන් වන්නේ මෙය නැකැත් උත්සවයක් වන බව හා ඉල් මස දී පැවැත්වීම නිසා ඉල් උත්සවය ලෙස නාමකරණය වන බව යි (වික්‍රමගේ, 1997).

කතරගම දේවාලයේ ඓතිහාසික පසුබිම හා පුද පූජා චාරිත්‍ර පිළිබඳ රචිත සාහිත්‍යය මූලාශ්‍රය රැසකි. ඒවාට කතරගම දේවෝත්පත්තිය, කතරගම දේවාල පුද සිරිත්, රුහුණු කතරගම ඇසළ මහා පෙරහැර, ගිනි පෑගීම, දිය කැපීම ආදී වාර්ෂික උත්සව ප්‍රස්තුත ව ඇත (ආටිගල, 2015; දේවප්‍රිය, 2021: ප්‍රනාන්දු, 2005: වික්‍රමගමගේ, 1997, සෝරත හිමි, 2009). එහෙත් කතරගම දේවාලයට අනුබද්ධ වැදගත් සංස්කෘතික අංගයක් වූ කතරගම ඉල්මහ පෙරහැර මංගල්‍යය පිළිබඳ ප්‍රමාණවත් සාකච්ඡාවක් උක්ත කෘති වල සිදු ව නැත. රුහුණු කතරගම දේවාලයේ

ඉල්මහ මංගල්‍යය පිළිබඳ දැක්වෙන අලුත් වැව සෝරත හිමි විසින් රචිත කතරගම පුද සිරිත් (2009) කෘතියෙහි ද අන්තර්ගත වන්නේ ඉල්මහ මංගල්‍යය අතීතයේ පැවැත් වූ ආකාරය පමණි. කැති නැකත භාවිත කරමින් මෙම උත්සවය සිදු වන බව හා එම නැකැත් චාරිත්‍ර ආරම්භයේ ඉතිහාසය සෝරත හිමියන් විසින් විස්තර කර ඇත. එහි දී කුරු ධර්ම ජාතකයේ හස ඉල්ලීස කතාවේ කාර්තිකෝත්සවයක් පිළිබඳ සඳහන් වන බව ද, ධනංජය රජතුමාගේ අවධියෙහි කාර්තිකෝත්සවය, මදනෝත්සවයක් ලෙස සිදු කළ බව ද, උන්මදන්තී ජාතකයේ මෙම උත්සවය ඉල් මාසයේ සිදු කළ බව ද සාකච්ඡාවට බඳුන් කර ඇත. එහෙත් ඊට අදාළ පුද පූජා හා චාරිත්‍ර පිළිබඳ ව සාකච්ඡා වී නොමැත. ඉල්මහ මහ මංගල්‍යය යන්න කුමක් ද පිළිබඳ ව කෙටි විස්තරයක් පමණක් අන්තර්ගත වන අතර සෝරත හිමියන් දක්වන්නේ ඉල්මහ මංගල්‍යය වෙනුවෙන් කතරගම දේවාලයේ සිදුවන ප්‍රධාන කාර්යය, පොල් තෙල් පහනින් මුළු දේවාලය ම ආලෝකවත් කිරීම බව යි (2009). උක්ත කෘතිය හැරුණු කොට වෙනත් කෘතිවල ඉල්මහ මංගල්‍යය පිළිබඳ ව වාර්තා වී නොමැති බව සාහිත්‍ය විමර්ශනයේ දී අනාවරණය විය. කතරගම ඇසළ පෙරහැර පිළිබඳ ව සමාජීය වශයෙන් මෙන් ම පර්යේෂණාත්මක ව ද වැඩි අවධානයක් පවතින බව පූර්ව අධ්‍යයනවල දි නිරීක්ෂණය විය. කතරගම පූදබිම ආශ්‍රිත ව සිදු කෙරෙන සිංහල හා දමිළ ජන සංස්කෘති බද්ධ කෙරෙන වැදගත් ආගමික හා සංස්කෘතික උලෙළක් වන ඉල්මහ මංගල්‍යය පිළිබඳ සිදු කෙරී ඇති පර්යේෂණ අවම වීම හේතුවෙන් ගොඩනැඟී ඇති පර්යේෂණ හිඩැස පූර්ණය කරලනු වස් මෙම පර්යේෂණය, ක්ෂේත්‍ර අධ්‍යයනය මූලික කොට ගනිමින් සිදු කරන ලදි .

ඒ අනුව මෙම පර්යේෂණය මගින් රුහුණු කතරගම දේවාලයේ ඉල්මහ මංගල්‍යයේ චාරිත්‍ර හා පුද පූජා අධ්‍යයනය කෙරිණි. විශේෂයෙන් ම කතරගම මහා දේවාලය ආශ්‍රිත අනෙකුත් උත්සව හා පෙරහැර හා සැසඳීමේ දී ඇතැම් විට මූලික ලක්ෂණ අතින් සාම්‍යයක් පෙන්නුම් කළ ද මෙම උත්සවයේ අභිප්‍රේරාර්ථ හා බැඳුණු චාරිත්‍රමය වෙනස්කම් හඳුනාගත හැකි බව ක්ෂේත්‍ර අධ්‍යයනයන්ගෙන් පැහැදිලි විය. එසේ ම ඇසළ පෙරහැර මංගල්‍යය සේ ම වටිනාකමක් සහිත මෙම ඉල්මහ පෙරහැර මංගල්‍යය පිළිබඳ සමාජීය දැනුවත්භාවය, පුද්ගල අවබෝධය හා ව්‍යාප්තිය අල්ප වේ. රුහුණු මහා කතරගම දේවාල පුද පූජා සිදු කිරීමේ නිල රාජකාරි මණ්ඩලය පෙරහැර මංගල්‍යය සඳහා පොදුවේ සහභාගි වන අතර රාජකාරි මණ්ඩලය එක් එක් පෙරහැර මංගල්‍යය සඳහා විශේෂිතකරණයක් නොමැති ව පාරම්පරික රාජකාරි කතරගම දෙවියන් උදෙසා සිදු කෙරේ. විශේෂයෙන් ම හින්දු හා බෞද්ධ ජනතාව මෙන් ම ඇතැම් විට මුස්ලිම් ජනයාගේ ද වන්දනයට පාත්‍රවන කතරගම පුද බිමෙහි පවත්වන ඉල් මහා මංගල්‍යය බහුවිධ සංස්කෘතික ලක්ෂණවලින් සමන්විත වූවකි. දිවයින පුරා ව්‍යාප්ත ව කතරගම දේවාලය රාශියක් ඇතත් ඉල්මහ මංගල්‍ය චාරිත්‍ර අතරට පූජාවක් වශයෙන් වීථි පෙරහැරක් එක්වන එක ම ස්ථානය රුහුණු මහා කතරගම ඉල්මහා මංගල්‍යය යි.

උක්ත පසුබිම කේන්ද්‍ර කර ගනිමින් රුහුණු කතරගම දේවාලයෙහි වාර්ෂික ව පවත්වන ඉල්මහ මංගල්‍යයට ආවේණික පුද පූජා සංස්කෘතියක් පවතී ද? යන ගැටලුව මූලික කරගෙන මෙම පර්යේෂණ සිදු කෙරිණි. ඒ සඳහා කතරගම ඉල්මහ මංගල්‍යය හා එහි පුද පූජා, චාරිත්‍ර වාරිත්‍ර හා ඒවා පවත්වන ස්වභාවය හඳුනාගැනීම හා කතරගම දේවාලයෙහි රාජකාරියෙහි නිරත වන කපු පරම්පරා පිළිබඳ අධ්‍යයනය කිරීම මෙන් ම අනෙකුත් කතරගම දේවාලවලට සාපේක්ෂ ව ඉල්මහ මංගල්‍යයේ ඇති විශේෂත්වය අනාවරණය කිරීම යන අරමුණු කොට ගනිමින් දත්ත රැස් කරන ලදි. විශේෂයෙන් ම කතරගම පුද බිම හා සම්බන්ධ ඇසළ පෙරහැර වඩාත් සමාජගත ව හා ජනප්‍රිය ව පවතින නිසා එම පෙරහැර හා සසඳමින් ඉල් මහා පෙරහැරේ පුද පූජා රටාව අධ්‍යයනය කරන ලදි.

කතරගම මහා දේවාලය මගින් පවත්වන අනෙකුත් උත්සව මෙන් පර්යේෂණාත්මක අධ්‍යයනයන්ට පාදක නොවුණ ද අතීතයේ සිට පැවත එන පුරාණ චාරිත්‍ර වාරිත්‍ර එලෙසින් ම වර්තමානයේ ද පවත්වනු ලබන, සිංහල හා දමිළ සංස්කෘතික ලක්ෂණ රැසක පිළිබිඹුවක් වන කතරගම ඉල්මහ මංගල්‍යය අභිමානවත් අස්පර්ශනීය සංස්කෘතික දායාදයක් ලෙස සමාජගත කිරීමට මෙම පර්යේෂණයෙන් හැකියාව ලැබේ.

## 02. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ශ්‍රී ලාංකේය සංස්කෘතික සන්දර්භයට අයත් ආගමික විශ්වාස, චර්යා විධි, පුද්ගල ආකල්ප හා හැසිරීම් අන්තර්ගත වූ අස්පර්ශනීය සංස්කෘතික අංගයක් පිළිබඳ ව සිදුකෙරුණු මානවවංශ පර්යේෂණයකි (Ethnographic research). කතරගම දේවාලය හා දේව සංකල්පයට අදාළ අතීත තොරතුරු හා වාර්තා අනාවරණය කර ගනිමින් ඓතිහාසික පර්යේෂණයක් (Historical research) වශයෙන් ද පර්යේෂණ කාර්යය සිදු කෙරිණි. විෂයමූලවාදී (Subjectivism) ප්‍රවේශයක් සහිත ව ක්ෂේත්‍ර අධ්‍යයනයන්ගෙන් රැස් කර ගන්නා ලද ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණයට බඳුන් කෙරිණි.

දත්ත රැස්කර ගැනීමේ දී ක්ෂේත්‍ර අධ්‍යයනය මෙන් ම පුස්තකාල අධ්‍යයනය ද යොදා ගන්නා ලදි. සම්මුඛ සාකච්ඡා හා ඍජු නිරීක්ෂණ ක්ෂේත්‍රගත දත්ත රැස් කිරීමේ ප්‍රධාන මූලාශ්‍රය විය. සම්මුඛ සාකච්ඡා සඳහා හිමබෝල හා විනිශ්චමය නියැදි ක්‍රම මගින් නියැදිය තෝරා ගැනිණි. සම්මුඛ සාකච්ඡා සඳහා දත්ත දායකයින් වූයේ කතරගම දේවාල සංස්කෘතිය සහ චාරිත්‍රවිධි පිළිබඳ ව අවබෝධයක්

ඇති විෂය ප්‍රාමාණිකයින්, බස්නායක නිලමේතුමන්, තේවාව බාර කපු මහතුන්, අනෙක් නිලධාරීන් හා තේවාව සිදු කරන පාරම්පරික ආලත්ති අම්මාවරුන් ය.

ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ සිදු කළ සෘජු නිරීක්ෂණ සඳහා රුහුණු මහා කතරගම දේවාලයේ 2022, 2023 හා 2024 වර්ෂයන්ට අදාළ ව පවත්වන ලද ඉල්මහ මංගල්‍යය තුනක් සහ ඒ ආශ්‍රිත චාරිත්‍ර නිරීක්ෂණයට බඳුන් කෙරිණි. එහි දී පෙරහැර ත්‍රිත්වයක් සෘජු නිරීක්ෂණයට ලක් විය. දේවාල තේවාවන් හා පූජා බාර කපු මහතුන් හා ආලත්ති අම්මාවරුන් *විසින් සිදු* කරන ලද චාරිත්‍ර විධි නිරීක්ෂණය කිරීම මගින් ඉල්මහ මංගල්‍යයේ සුවිශේෂ වත් පිළිවෙත් හා ඊට අදාළ සම්ප්‍රදායයන් අනාවරණය කෙරිණි.

ඉල් මහා මංගල්‍යයේ සංස්කෘතික පසුබිම අනාවරණය කරනු වස් ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කරන ලදි. ඒ සඳහා හින්දු ආගමික සාහිත්‍ය මූලාශ්‍රය, ඓතිහාසික මූලාශ්‍රය, පර්යේෂණ ලිපි, ග්‍රන්ථ හා පුවත්පත් පරිශීලනය සිදුවිණි.

## 03. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 ඉල්මහ මංගල්‍යයට විශේෂ වූ පුද පූජා සහ චාරිත්‍ර

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි ස්ථාපිත කතරගම මහා දේවාල අතර ඉල්මහ මංගල්‍යය සඳහා වීථි සංචාරය කෙරෙන පෙරහැරක් සහිත පුද පූජා සිදුවන එක ම ආගමික ස්ථානය රුහුණු මහා කතරගම දේවාලය යි. රුහුණු මහා කතරගම දේවාලයෙහි අනෙකුත් වාර්ෂික පෙරහැර මංගල්‍යය හා සාම්‍ය ලක්ෂණ මෙන් ම ඒවාට වෙනස් වූ අනන්‍යතා ලක්ෂණ ද මෙහි විද්‍යමාන ය. සාමාන්‍ය පෙරහැරක අන්තර්ගත සාම්ප්‍රදායික නර්තන හා බෙර වාදන මෙන් ම චාරිත්‍රවාරිත්‍ර ද ඉල්මහ මංගල්‍ය පෙරහැරට අන්තර්ගත ය.

එහෙත් මංගල්‍යය පැවැත්වීමේ ස්වභාවය, කාලය හා අභිප්‍රේතාර්ථ මත එයට ම ආවේණික ව අනෙකුත් දේවාල පෙරහැරවලට වඩා වෙනස්වන අවස්ථා රැසක් හඳුනා ගැණිනි. උග්ගල් අලුත්නුවර කුඩා කතරගම දේවාලය, බදුල්ල කුඩා කතරගම දේවාලය වැනි ලංකාවේ විවිධ ප්‍රදේශ ආශ්‍රිත ව පවත්නා අනෙකුත් කතරගම දේවාලවල ද ඉල්මහ මංගල්‍ය ආශ්‍රිත පුද පූජා චාරිත්‍ර සිදු වේ.

නමුත් වීථි පෙරහැරක් සිදුවන්නේ රුහුණු මහා කතරගම දේවාලයේ පමණි. උග්ගල් අලුත් නුවර ඉල්මහ මංගල්‍යය චාරිත්‍ර සිදු කිරීමේ දී රාජකාරි මණ්ඩලය ප්‍රමුඛ මලුවේ පෙරහැරක් සිදු වන අතර උඩරට ප්‍රදේශ ආශ්‍රිත ව කාර්තික මංගල්‍යය සිදු වන්නේ පහන් දැල්වීමෙනි. මෙහි දී විහාර දේවාල 58ක පහන් දැල්වීම සිදු කරයි. මෙලෙස පහන් දැල්වීමට තෙල් ලබා දෙනු ලබන්නේ ශ්‍රී දළදා මාලිගාව මූලිකත්වයෙනි.

රුහුණු මහා කතරගම දේවාලයේ ඉල්මහ මංගල්‍යය පෙරහැර සංස්කෘතියෙහි චාරිත්‍ර ධාරා ත්‍රිත්වයක් යටතේ විග්‍රහ කළ හැකි ය.

1) පූර්ව චාරිත්‍ර

2) පෙරහැර පවත්වන දින සිදු කරන චාරිත්‍ර

3) පෙරහැර පැවැත්වීමෙන් පසු චාරිත්‍ර

රුහුණු මහා කතරගම දේවාලයෙහි පවත්වන අනෙකුත් වාර්ෂික පෙරහැර මංගල්‍ය හා බැඳුණු සාම්ප්‍රදායික චාරිත්‍ර ඉල්මහ පෙරහැර සඳහා ද සිදු කරනු ලැබේ. නැකැත් නියම කිරීම, රාජකාරි මණ්ඩලය කැඳවීම, නැකැත් දැනුම් දීම, බැද්දේ කණු සොයන්න යෑම, බැද්දේ කණු කපන්න යෑම, කප් සිටු වීම, ආලත්ති අම්මාවරු වට වී කෙටීම සහ ගොම මැටි ගෑම, රාජකාරි මණ්ඩලය පෙරහැරට කලින් දා පැමිණ බස්නායක නිලමේ හට බුලත් දීම පූර්ව චාරිත්‍ර ලෙස ලෙස සෑම පෙරහැරකට ම පූර්වයෙන් පවත්වයි. එහෙත් ඇසළ පෙරහැරෙහි සිදු කරන බැද්දේ කණු සෙවීම හා කැපීම, කප් සිටු වීම ආදී චාරිත්‍ර ඉල් මහා මංගල්‍යයේ දී සිදු කෙරෙන්නේ නැත. විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ පෙරහැර සංස්කෘතියට ආවේණික චාරිත්‍රයක් වූ කප් සිටුවීම සිදු නොකිරීම ඉල් මහා මංගලය පෙරහැරෙහි විශේෂත්වයකි.

පූර්ව චාරිත්‍ර පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පුරාණ චාරිත්‍ර, නක්ෂත්‍රානුකූල නැකැත් අනුව පුරාණ සාම්ප්‍රදායික වත් පිළිවෙත්වලට අනුගත ව සිදුකෙරේ. ඇසළ මහා පෙරහැර, අලුත් අවුරුදු පෙරහැර මෙන් ම ඉල්මහ පෙරහැර සිදු වන්නේ ද නැකැත් මූලික වෙමිනි. ඉල් මහා මංගල්‍යයෙහි විශේෂත්වය වන්නේ එය කැති නැකත මූලික කොට ගෙන සිදු වීම යි. මෙදින පූර්ණ චන්ද්‍රයා උදා වන්නේ සුබ ග්‍රහයෙකු සමඟ ය. එනිසා එදින විශේෂිත දවසක් වේ. එමෙන් ම මෙම කැති නැකත පසළොස්වක පොහොය මුල් වී යෙදීම ද විශේෂත්වයකි. නොවැම්බර් මස ඉල් පොහෝ දිනට කැති නැකත නොයෙදුණහොත් බෙරණ, රෙහෙණ නැකැත් පිළිබඳ අවධානය යොමු කෙරෙන එසේත් නැතහොත් උඳුවප් පුර පොහෝ දිනට යෙදෙන කැති, බෙරණ, රෙහෙණ නැකතක් අනුව මෙම ඉල් මංගල්‍යය සිදු කෙරේ. උක්ත නක්ෂත්‍ර නියමයන්ට අනුව 2025 වර්ෂයේ ඉල්මහ පෙරහැර නොවැම්බර් මස දී නොව උඳුවප් මස පෝය දිනට යෙදී ඇති බව අධ්‍යයනයේ දී අනාවරණය විය. 'කැති' නැකත උදාවන තෙක් දෙවියන් දෙවොලෙන් පිටතට වැඩම වීම සිදු නොකෙරේ. එසේ ම මෙම කැති නැකත පූර්ණ විය යුත්තේ ද පොහොය දිනය මූලික කර ගනිමිනි. නැකැත් සෑදීමේ දී කැති නැකත රාත්‍රී කාලයේ යෙදිය යුතු අතර ම පොහොය දිනයක් ද විය යුතු ය යන කාරණා ද්විත්වය සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දෙයි. මෙම උත්සවය හින්දු සංස්කෘතියේ දී "කාර්තිකේය තීබම්" ලෙස හඳුන්වයි

(Razid, 2024). ඇසළ මංගල්‍යයේ දී නැකැත් චාරිත්‍ර පිළිබඳ අවධානය යොමු කෙරෙන්නේ පළමු පෙරහැර මංගල්‍යයේ දී හා අවසන් පෙරහැර මංගල්‍යය සිදු වන දිනයේ දී පමණි. එමෙන් ම අලුත් අවුරුදු පෙරහැර මංගල්‍යයේ දී ද සියලු චාරිත්‍ර හා පුද පූජා විධි සිදු කිරීම සඳහා සාමාන්‍ය නැකත් මූලික කර ගනී. ඉල්මහ මංගල්‍යයේ දී මෙන් 'කැති' නැකත මෙන් සුවිශේෂ වූ නැකැත් හෝරාවක් කතරගම වෙනත් කිසිදු පෙරහැර මංගල්‍යයක් සඳහා භාවිත නොකෙරේ. කපුමහතුන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා මඟින් අනාවරණය වූයේ කතරගම දෙවියන්ගේ උපත කැති නැකත මූලික කරගනිමින් සිදුවූයේ යැයි පවත්නා විශ්වාසය හේතුවෙන් ඉල් පෙරහැර සඳහා කැති නැකත ම භාවිත කරන බවකි.

කතරගම දේවාල මංගල්‍යයන් සඳහා නැකැත් බැලීම සහ නැකැත් බෙදීම සිදු කෙරෙන්නේ නැකැත් රාළ මඟිනි. ඉල් මංගල්‍ය නැකැත් කටයුතු ද ඒ අනුව අදාළ රාජකාරි අනුව සිදු කෙරේ. ඔක්තෝම්බර් මස අග රුහුණු මහා කතරගම දේවාලයේ නැකැත් රාළ ඉල්මහ මංගල්‍යය සඳහා නැකැත් බැලීම සිදු කරන අතර එම නැකැත් සීට්ටුව මහබෙත්මේ ලේකම්ට ලබා දෙයි. අනතුරු ව මහබෙත්මේ ලේකම් දේවාලයෙහි රාජකාරි සිදු කරන සියලු රාජකාරිකරුවන්ට ලියුම් ලබා දෙයි. එම ලියුම්වල සඳහන් වන්නේ ඉල්මහ මංගල්‍යයට සූදානම් වීම සඳහා බස්නායක නිලමේ හමු විය යුතු බවකි. රුහුණු මහා කතරගම දේවාලයේ නැකැත් රාළ ඉල්මහ මංගල්‍යය වෙනුවෙන් ප්‍රධාන නැකැත් ද්විත්වයක් ලබා දෙයි. එනම් වත බැඳීමේ නැකත සහ ගෙවැදීමේ නැකත යි. දෙවියන් වැඩම වන ආසනය, එනම් වත පුටුව ඇතා පිට බැඳීමෙන් පසුව සුදුසු සුබ වෙලාවක නැකැත් චාරිත්‍ර අනුව සළු පැලඳීම හා මාල පැලඳීම සිදු කරන අතර එම සුභ වෙලාව වත බැඳීමේ නැකත ලෙස හැඳින්වෙන අතර වල්ලි අම්මා දෙවොලට පෙරහැර ගමන් කිරීමෙන් අනතුරු ව නැවත දෙවියන් හා දේව ආභරණ කතරගම මහ දෙවොලෙහි තැම්පත් කිරීමට ද සුබ හෝරාවක් බලනු ලැබේ. එම සුබ හෝරාව ගෙවැදීමේ නැකත ලෙස හඳුන්වයි. කතරගම අනෙක් පෙරහැර මංගල්‍යයන්හි දී උක්ත චාරිත්‍ර නැකත් වේලාව අනුව සිදු වුව ද නැකැත් හෝරාවන්හි විෂමතා දැකිය හැකි ය.

පෙරහැර දින සිදු කරන චාරිත්‍ර වාරිත්‍ර බොහොමයක් කතරගම ඇසළ පෙරහැර මංගල්‍යයට හා අලුත් අවුරුදු පෙරහැරට සමාන ව සිදු කරයි. ඇසළ පෙරහැර රුහුණු මහා කතරගම දේවාලයේ ප්‍රධානතම පෙරහැර වුවත් ඉල් මහා පෙරහැර ද ඊට නොදෙවෙනි ව සමාන චාරිත්‍ර සහිත ව ඉදිරිපත් කෙරේ. ඒ අතර දවුල හං කිරීම, වත බැඳීම ආරම්භය, දෙවියන් වැඩම වීම හා පෙරහැර ආරම්භ කිරීම, බස්නායක නිලමේ ගමන් කිරීම, වල්ලි අම්මා දේවාලයට පෙරහැර ගෙවැදීම, වල්ලි අම්මා දේවාලයේ මුරුතැන් පූජාව සිදු කිරීම, නැවත පෙරහැර මහා දේවාලය වෙත ගමන් කිරීම, මහා දේවාලයට ගෙවැදීම, මුරුතැන් පූජාව සිදු කිරීම, දෙවේලේ පෙරහැර ගමන් කිරීම ආදී චාරිත්‍ර පෙරහැර දින සිදු කරන චාරිත්‍ර වන අතර මෙම චාරිත්‍ර හා පුද පූජා රුහුණු මහා කතරගම දේවාල පෙරහැර සංස්කෘතියේ දී භාවිත වන්නේ පෙරහැර මංගල්‍යයයේ ස්වභාවය අනුව ය. උක්ත සඳහන් අයුරින් පාරම්පරික ව පැවත එන චාරිත්‍ර රාශියක් රුහුණු මහා කතරගම පෙරහැර මංගල්‍යය ආශ්‍රිත ව සිදු වේ. පෙරහැර මංගල්‍යයන්හි දී එක් එක් කාර්යභාරය සඳහා සුවිශේෂි පුද්ගලයෝ සිටිති. අතීතයේ සිට පැවත ආ කාර්යභාර ධුරාවලිය විවිධ පුද්ගල කොටස් වෙත පැවරී ඇත. මේවා සිදු වන්නේ නිල පංගු ක්‍රමයක් මත ය. නිලයක් ලෙස නාමකරණය වන්නේ තනතුර ය. මෙහි දී කපු මණ්ඩලයේ සිට පාවාඩ නිලය තෙක් රාජකාරි වර්ගීකරණය වේ. ගොටුමහන නිලය, දවුල්කාර මුහන්දිරම් නිලය, හක් නිලය, හොරණෑ නිලය, පාවඩ නිලය, උඩුවියන් නිලය, නැටුම් නිලය, පිරිත් නිලය, අධිකාරම් නිලය, කත් නිලය, හේනේ පංගුව හෙවත් පේඩි නිලය ඒවා අතර වේ. පෙරහැර මංගල්‍යයේ දී බස්නායක නිලමෙ වලව්වට අයත් ගොටුව ද, පෙරහැර බලන රාළට අයත් ගොටුව ද, අදිකාරම් නිලමේ සඳහා ද, ගම්පහ විදානේ, හේවිසි මණ්ඩලය ආදී ලෙස අදාළ ගොටු ලබා දීම ගොටු මහන නිලය විසින් සිදු කළ යුතු ය. "ගොටුව" ලෙස මෙහි දී හඳුන්වන්නේ නුග පත්‍රවලින් සාදන ලද නිමැයුමකි. එනම් නුග කොළයෙන් සාදනු ලබන ගොටුවකි. කතරගම දෙවියන් වෙත පූජා කරනු ලබන මුරුතැන් පූජාව දෙවියන්ට පිළිගැන්වීමෙන් අනතුරුව පිළිවෙළින් කතරගම දෙවියන්ට රාජකාරි සිදු කරන පිරිසට ලබා දිය යුතු ය. පිළිවෙළින් බස්නායක නිලමේ ඇතුළු රාජකාරි මණ්ඩලයට බෙදා දෙනු ලැබේ. එය ගොටු මහන නිලයේ රාජකාරියකි. පිරිත් නිලය ඉල්මහ පෙරහැර දින පිරිත් දේශනය සිදු කිරිම, නැකැත් රාළ පෙරහැර දිනට සහ චාරිත්‍ර සඳහා අවශ්‍ය නැකැත් සිදු කළ යුතු ය. එමෙන් ම අධිකාරම් නිලය බස්නායක නිලමේ සිටින මැඳුරට පෙරහැර මංගල්‍ය දිනයේ දී කහ දියර ඉසීම, පෙරහැර ගමන් කිරීමට ඉඩ ලබා ගැනීම, කපු මණ්ඩලයට පැහැදුම් මලු ලබා දීම, රෙදි පඩි හා සියලු නිල රාජකාරි මණ්ඩලයට පොරොන්දු පඩි ලබා දීම, පෙරහැරේ ගමන් කරන සියලු රාජකාරිකරුවන්ට විවිධ ප්‍රමාණ අනුව වී පඩි දීම සිදු කරයි. උඩුවියන් නිලය මුරුතැන් කඳ දෙවියන් වෙත රැගෙන ඒමේ දී උඩුවියන් ඇල්ලීම ද මුහන්දිරම් පන්දම් නිලය දවුල්කාර මුහන්දිරම් පෙරහැරේ ගමන් කරන විට පන්දම් ඇල්ලීම ද ආදී වූ රාජකාරි රාශියක් සිදු කර ඇත. (රණසිංහ, 2011).

කතරගම මහා දේවාලය භූමියේ දේවාල ත්‍රිත්වයක් දැකිය හැකි අතර ඉල්මහ පෙරහැර මංගල්‍යයේ දී මහා දේවාලයට අමතර ව තේවානි අම්මා දේවාලය වැදගත් වේ. තේවානි අම්මා ලෙස හැඳින්වෙන්නේ ස්කන්ද කුමරුගේ භාර්යාවන් දෙදෙනාගෙන් ඉන්දියානු සම්භවයක් සහිත භාර්යාව යි. තේවානි අම්මා කෝවිලෙහි රාම ක්‍රිෂ්ණ යෝගී භාවනා ක්‍රම

පවතින අතර එම දෙවොල නිර්මාණය කර ඇත්තේ ගෝපුර වාසල් හැඩයෙන් යුක්තව පොළොන්නරු සමයට අයත් ශිව දේවාල අනුව හුණු බදාමයෙන් ය *(රණසිංහ,* 2011*).* ඉල්මහ මංගල්‍යයේ දී වල්ලි අම්මා දෙවොල ආශ්‍රිත ව සිංහල සංස්කෘතිය මූලික වෙමින් පුද පූජා සිදු වන විට තේවානි අම්මා දෙවොලෙහි ඉන්දියානු සංස්කෘතිය මුල් වෙමින් පුද පූජා සිදු කරනු ලැබේ. දිවයිනේ වෙනත් ආගමික සිද්ධස්ථානයක නොදැකිය හැකි විශේෂ ලක්ෂණයක් සේ මෙය හැඳින්විය හැක. එහි දී දෙවොල බිම සහ කුඩා දේව පිළිම අසල පහන් ආලෝක දැල්වීම විශේෂත්වයකි. දේවාල බිම පහන් පත්තු වීම සිදුවන්නේ මෙම මංගල්‍යයේ දී පමණක් වන අතර ඇසළ මංගල්‍යයේ දී හෝ වෙනත් කිසිදු උත්සව අවස්ථාවක දී මෙලෙස පහන් ආලෝකවත් කිරීම සිදු නොවේ. එක ම පූජා භූමියක් තුළ එක දේව සංකල්පයක් මූලික කොට ගෙන සිංහල හා ද්‍රවිඩ ආගමික වතාවත් සිදු කිරීම කතරගම පුද බිම තුළින් ප්‍රකට කෙරෙන ආගමික සහජීවනය පිළිබඳ මනා සාධකයකි. කතරගම මහ දෙවොලේ පූජා කටයුතු දේශීය හේරි වාදන මූලික කර ගනිමින් සිදු කළ ද වල්ලි අම්මා දේවාලයේ දී සියලු පුද පූජා ඉන්දියානු හේරි හා සංගීත භාණ්ඩ අතරට එක්වන තවිල් බෙරය හා නාදස්වරම් නාදය මධ්‍යයේ සිදු වේ. එහි දී පෙරහැරක් පැවැත්වීම සිදු නොවේ. දේවාල අභ්‍යන්තරයෙහි පුද පූජා පමණක් සිදු වේ. ඉන්දියාවේ තමිල්නාඩුවේ "තිරුවනමලෙයි කන්ද " ආශ්‍රිත ව "කාර්තිකේය තීබම්" උත්සවය ආරම්භ කරන අවස්ථාවේ දී එම නැකතට කතරගම තේවානි අම්මා කෝවිලේ පහන් දැල්වීම විශේෂත්වය කි. මෙය මුරුගන් හෙවත් කාර්තිකේය දෙවි උදෙසා ක්‍රි. පූ දෙවන හා තෙවන සියවස්වල සිට ම තමිල්නාඩු ප්‍රාන්තයේ සමරන ආගමික උත්සවයකි. නොවැම්බර් හෝ දෙසැම්බර් මස තෙදින උත්සවයක් ලෙස සිදු කරන මෙය විශේෂයෙන් පොහොය දින සිදු කිරීම විශේෂත්වයකි. ඉන්දියාවේ නිවෙස් ඉදිරිපිට කෝලම් මෝස්තර හා මල්රටා ඇඳීම මෙදිනට සිදු කරන අතර ගෙදර උළුවස්ස අඹ කොළ පත්‍ර වලින් සැරසීම සිදු කරයි. පහන් දැල්වීම "කාර්තිකේය තීබම්" උත්සවයේ දී විශේෂ වේ. එසේ ම විවිධ විලක්කු වර්ග දැල්වීම ද, එනම් ලක්ෂ්මී විලක්කු (කාන්තාවකගේ හැඩය), කුතු විලක්කු (පෙතිපහේ මලේ හැඩය), ගජලක්ෂ්මී විලක්කු (අලියෙකුගේ හැඩය) ආදිය දැල් වීම ආවේණික සිරිතක් වන අතර "තිරුවනමලෙයි කන්ද" මුදුනෙහි විශාල ගිනි මැලයක් දැල්වීම ද මෙහි දී සිදු වෙයි. කෙසේ වෙතත් දේශීය වශයෙන් මෙම ඉල්මහ මංගල්‍යය පාදක කොට ගනිමින් ගෘහස්ත පුද පූජා විධි සිදු කරන්නේ නැත.

කතරගම සෑම පෙරහැර මංගල්‍යයක දී ම කතරගම දෙවිඳුන්ගේ දේව ආභරණ සංකේතවත් ව වැඩම කර වීම සිදු වේ. එය දෙවියන් වැඩම වීම ලෙස නාමකරණය කෙරේ. මෙහි දී සිදු කරන විශේෂ වතාවත් කිහිපයකි. ඒවා කතරගම අනෙකුත් දේවාල පෙරහැරවල මෙන් ඉල් මහා පෙරහැරේ දී ද පවත්වනු ලැබේ. වත බැඳීමේ චාරිත්‍රය ඒ අතුරින් විශේෂ ය. ඒ සඳහා මූලික ව ම වත පුටුව යන භාණ්ඩයක් නිර්මාණය කර ගනී. වත පුටුව යනු දෙවියන් වැඩම වීමේ ආසනය යි. මෙය වාඩිවිය හැකි අසුනකි. දේව ආභරණ වැඩමවන ඇතාගේ පිට මත බඹ 17 පමණ දිග වූ කඹයක් තුනට නමා "වත පුටුව" බඳින අතර ඉන් පසු ව "වත පුටුව" මත මුතු කුඩය සවි කරයි. එම වත පුටුවට "කොට්ට සළුව" වඩම්මන අතර අනතුරුව "වත පුටුව" සළු තුනකින් සරසනු ලබයි. මෙහි විශේෂත්වය වන්නේ ඉල්මහ මංගල්‍යය පෙරහැරේ දී මුතුකුඩයේ සළුවෙහි වර්ණය තීරණය වන්නේ අදාළ දිනට නියමිත ග්‍රහයාගේ වර්ණය යි. "වත පුටුව" සළුවලින් සැරසූ පසු මාල බැඳීම සිදු කරයි. එහි දී මාල නවයක් භාවිත කරයි. "*එහි දී හීන් දම්වැල් මාලය, මහ දම්වැල් මාලය, හීන් පදක්කම් මාලය, මහ පදක්කම් මාලය සහ පොල් මල් මාලය යන පංචවිධ මාලවලින් මුතු කුඩය සරසා මුතු කුඩයේ මුදුන එකතු කර නූලකින් රැලි පාලම බඳිනු ලැබෙයි*" *(රණසිංහ,* 2011, පි. 70) උක්ත සඳහන් අවස්ථාව "වත බැඳීම" ලෙස නම් කෙරෙයි. මෙම චාරිත්‍රය සිදු වන්නේ රුහුණු මහා කතරගම දේවාලයේ පාරම්පරික වාදන ශිල්පීන් සිදු කරන දවුල්, තම්මැට්ටම් හා හොරණෑ වාදන මධ්‍යයේ ය. ''වත බැඳීමේ චාරිත්‍රය'' හා ''දෙවියන් වැඩම වීමේ'' යන චාරිත්‍ර ද්විත්වය නැකැත් හෝරා මූලික කර ගනිමින් ඇසළ පෙරහැර මංගල්‍යයේ දී දින දෙකක් පමණක් සිදු වේ. ඒ පළමු දිනය හා අවසන් දිනය යි. එනම් ඇසළ පෙරහැර මංගල්‍යය දින කිහිපයක් පැවැතුණ ද නැකැත් චාරිත්‍ර යොදා ගනිමින් පෙරහැර මංගල්‍යය සිදු කෙරෙන්නේ එම දින දෙකක් පමණි. ඉල්මහ පෙරහැර මංගල්‍යය එක් දිනක් තුළ පමණක් සිදු වුවත් මෙම චාරිත්‍ර ද්විත්වය නැකැත් මූලික වෙමින් සිදු වේ. අවුරුදු පෙරහැර මංගල්‍යයේ දී එදින සිදු කරන සියලු චාරිත්‍ර ද නැකැත් චාරිත්‍ර මූලික කරගනිමින් සිදු කරයි. නමුත් ලාංකේය කතරගම දේවාලය ආශ්‍රිත ව වෙනත් කිසිදු දේවාලයක මෙම චාරිත්‍ර දැකිය නොහැකි අතර රාජකාරි මණ්ඩලය පමණක් මූලික වෙමින් සිදු කරන පූජා චාරිත්‍ර පමණක් දැක ගත හැකි ය.

ගෙවදීම චාරිත්‍රය ද කතරගම පෙරහැර මංගල්‍යයවල දී සිදු වන වැදගත් අංගයකි. ඉල් මහා මංගල්‍යය ද ඊට අනුකූල ව මෙම චාරිත්‍රය පවත්වනු ලැබේ. ගෙවදීම චාරිත්‍රය ලෙස හඳුන්වන්නේ කතරගම දෙවියන්ගේ දේව ආභරණ පෙරහැරේ ගමන් කරවීමෙන් අනතුරු ව නැවත මහා දේවාලයෙහි තැම්පත් කිරීමේ අවස්ථාව යි. මෙහි දී වල්ලි අම්මා දෙවොලට ආභරණ වැඩමවීම හා එම වැඩමවීමෙන් අනතුරු ව නැවත මහ දේවාලයට ගෙවැද්දවීම ද ඇතුළත් ය. "පළමු ව ඉර හඳ කොඩි රැගත් කොඩිකරුවන් දේවාලය ඉදිරිපස අතුපන්දල දෙපස සිට ගන්නා අතර පෙරහැරට සහභාගී වූ බොහෝ දෙනෙක් විහාරයට හා දෙවොලට නමදිති. ඒ අනුව පෙරහැරට සහභාගී වූ ඇත්තු ද දෙවොලට නමදිති. බස්නායක නිලමේ දේවාලයට පැමිණීමෙන්, දෙවියන් දේව මාලිගාවට ගෙවැද්දවීමෙන් අනතුරුව

මංගල ඇත් හාමි ද දෙවොල නමදියි" (රණසිංහ, 2011, පි. 83). පෙරහැරින් කතරගම දෙවියන් හා දේව ආභරණ මහා දේවාලයට ගෙවැද්දූ පසු ව එදින තේවාව සිදු කරන කපු මහතා ගොටුමහන රාජකාරිකරුවන්ට අඟුරු කුඩිච්චිය ලබා දෙන අතර අනතුරුව එදින රාත්‍රී පුද පූජා කටයුතු සිදු වේ. දෙවියන් හා දේව ආභරණ තැම්පත් කිරීමෙන් හා ඉල්මහ පෙරහැරෙන් පසු ව සිදු කරන පළමු කතරගම දේව පූජාව සිදු කරන අතර එම දේව පූජාව සඳහා ආලත්ති අම්මාවරු දොළොස් දෙනා ද සම්බන්ධ වේ. අඟුරු කුඩිච්චිය ලෙස හඳුන්වන්නේ දෙවියන් සඳහා දුම් ඇල්ලීමට භාවිත කරන දුම් කබලයි. අලුත් අවුරුදු මංගල්‍යයේ දී පමණක් ''ගෙවදීමෙන්'' අනතුරු ව මුරුතැන් බෑම නැකැත් හෝරාවක් අනුව සිදු කෙරෙන අතර ඉල්මහ මංගල්‍යයේ දී එසේ සිදු නොකිරීම ද විශේෂත්වයකි. අලුත් අවුරුදු පෙරහැර මංගල්‍යයේ දී ගෙවදීමෙන් පසුව මුරුතැන් බෑම සිදු කරන්නේ ද අවුරුදු මංගල්‍යය සඳහා නියම කරන ලද නැකැත් කාල හෝරාවක් අනුව ය. එහෙත් ඉල්මහ මංගල්‍යයේ දී මුරුතැන් පූජාව සඳහා නැකැත් භාවිතයක් සිදු නොවේ. එසේ ම ඇසළ මංගල්‍යයේ දහවන දින පෙරහැර ගෙවදීමෙන් පසුව දෙවේලේ පෙරහැර යනුවෙන් රාජකාරි මණ්ඩලය පමණක් ගමන් කරන විශේෂිත පෙරහැරක් දැකිය හැකි ය. මෙවැනි පෙරහැරක් ඉල්මහ මංගල්‍යයේ දී දැක ගත නොහැකි වේ.

ඇසළ මංගල්‍යය අවසන් වී කපු මණ්ඩලයට හා රාජකාරි මණ්ඩලයේ සියලු දෙනාට පොරොන්දු පඩි ලබා දී ඊළඟ වසරට රාජකාරි සිදු කිරීමට නිලධාරීන් පත් කර ගැනීමෙන් පසු සිදු කරන පළමු මංගල්‍යය වන්නේ ඉල්මහ මංගලය යි. එසේ ම කතරගම ඇසළ පෙරහැර මංගල්‍යයේ දී හය වන දිනයේ සිට බස්නායක නිලමේ ගමන් කිරීම අනිවාර්ය රාජකාරියක් වුව ද ඉල්මහ මංගල්‍යය පෙරහැර මංගල්‍යයේ දී බස්නායක නිලමේ පෙරහැරේ ගමන් කිරීම අනිවාර්ය රාජකාරියක් නොවීම මෙම උත්සව මංගල්‍යයේ දී හඳුනාගත් විශේෂතාවයකි. එහි දී බස්නායක නිලය නියෝජනය කරමින් මහබෙත්ම නිලය ගමන් කරනු ලැබේ. එසේ ම කතරගම ඇසළ පෙරහැර මංගල්‍යයන්හි දී වීථි සංචාරය කිරීමේ දී ගණ දේවාලය, බහිරව දේවාලය, රාම ක්‍රිෂ්ණ මඩම, සතර දේවාලය, මහාභද්‍රකාලි දේවාලය අසල ඇති බෝධිය, අභිනවාරාමය යන ප්‍රධාන ස්ථානවලට අමතර ව තවත් ස්ථාන අටක දී දවුල්කාර මුහන්දිරම් විසින් ''නඩත්තු පද'' නම් බෙර තාල 32ක් වාදනය කරනු ලබයි. නමුත් ඉල් මහා මංගල්‍යයේ පෙරහැර වීථි සංචාරයේ දී මෙම සියලු ස්ථානයන්හි නඩත්තු පද වාදනය සිදු නොවන අතර ස්ථාන කිහිපයක දී පමණක් නඩත්තු පද වාදනය කෙරේ. විශේෂයෙන් මෙම පෙරහැර මංගල්‍යයේ දී ඇසළ පෙරහැර මංගල්‍යයට සාපේක්ෂ ව අඩුවෙන් නඩත්තු පද වාදනය කිරීම සිදු වේ. නඩත්තු පද ලෙස හැඳින්වෙන්නේ බෙර වාදන සම්ප්‍රදායේ පවතින බෙර පද විශේෂයකි.

"තත් තකට දෙවි දකිම්, තත් තකට මුනි දකිම්, මුනි දකිම්, දෙවි දකිම් " ආදී ලෙස නඩත්තු පද වාදනය කෙරේ.

පෙරහැර මංගල්‍යයෙන් පසු සිදු කරන පුද සිරිත් පිළිබඳ අධ්‍යයනයේ දී කතරගම දෙවොලට අයත් දිරාපත් වූ දෑ, කතරගම මැණික් ගඟේ එක් දිය තොටක් වන "දිය මුදුන් තොටින්" පා කිරීම ඉල්මහ මංගල්‍යයේ දී සිදු කෙරෙන විශේෂිත වූ චාරිත්‍රයක් ලෙස හඳුනාගත හැකි විය. විවිධ අවශ්‍යතාවයන් සඳහා මැණික් ගංගාවේ තොටුපොළ කිහිපයක් යොදා ගැනේ. ''කතරගම මහා දේවාලය හා සම්බන්ධ විවිධ අභිචාර විධිවල දී, දුටුගැමුණු රාජ්‍යය සමයේ සිට අද දක්වා විවිධ කාර්යයන් සඳහා මෙකී තොටුවල් භාවිත කරනු ලැබේ. මැණික් ගඟ ශුද්ධ නදියක් ලෙස පූජනීයත්වයට පත්වීමට ද මෙය හේතුවන්නට ඇත'' (සිල්වා, 2023, පි 25). ඉල්මහ මංගල්‍යයේ දී කතරගම දෙවොලට අයත්ව තිබූ භාවිතයට ගත නොහැකි දිරාපත් වූ දෑ පා කර හරින්නේ මෙම දිය තොටිනි.

වල්ලි අම්මා යනු ස්කන්ද කුමාරගේ බිරින්දෑවරුන් දෙදෙනාගෙන් අයෙකි. වල්ලි දෙවඟන කතරගම තණහේනක උප්පැත්ති ලබා ඇති බවත් ඇය වැදි පරපුර නියෝජනය කරන බවත් පිළිගත් මතයකි. (දේවප්‍රිය, 2015). වල්ලි දෙවඟන සිහිවීම පිණිසත් වල්ලි දෙවඟනගේ පරපුර නියෝජනය පිණිසත් වර්තමානයේ කතරගම පෙරහැර මංගල්‍යයන්වල දී ආදී වාසීන්ට චාරිත්‍ර ඉටු කිරීමට අවස්ථාව ලබා දී ඇති අතර දෛනික පූජාවල දී ද වල්ලි දෙවඟනගේ පරපුර නියෝජනය පිණිස ආලත්ති අම්මාවරු 12 දෙනෙක් කතරගම දෙවියන් වෙනුවෙන් පුද පූජා සිදු කරති. කතරගම දෙවියන්ට පුද පූජා සිදු කරන ඉල්මහ මංගල්‍යය, අලුත් අවුරුදු මංගල්‍යය, ඇසළ මංගල්‍යය වැනි උත්සවවල දී වල්ලි දේවාලය වෙත පැමිණ චාරිත්‍ර ඉටු කිරීම දුටු ගැමුණු නියෝගය අනුව අදත් සිදු කෙරේ (දේවප්‍රිය, 2015). මෙනිසා කතරගම ඉල්මහ මංගල්‍යයේ දී කතරගම දේවාලය හා සමාන ව වල්ලි අම්මා දේවාලය ද විශේෂ වේ. ඉල්මහ මංගල්‍යයේ දී කතරගම මහා දේවාලයෙන් පිටත් වන පෙරහැර මඟුල් වීථියෙහි ගමන් කිරීමෙන් අනතුරු ව වල්ලි අම්මා දේවාලය වෙත ගමන් කරන අතර එහි දී කතරගම දෙවියන් උදෙසා දේව පූජාව වල්ලි දේවාලයේ දී පැවැත් වේ. කතරගම දෙවියන් වල්ලි මාතා දේවාලයට වැඩමවීමට පළමුව චාරිත්‍ර කිහිපයක් වල්ලි අම්මා දේවාලයෙහි සිදු කරන අතර විශේෂයෙන් "කේශරී" නැමති රස කැවිල්ල කතරගම දෙවියන් වෙනුවෙන් සකසනු ලැබේ. කතරගම දෙවියන් පෙරහැරින් වඩමවන තෙක් ශබ්ද පූජාව සිදු කෙරේ. අනතුරු ව දෙවියන් වඩමවා දවුල් නාදය මධ්‍යයේ ම වල්ලි අම්මා දෙවොලෙහි තේවාව සිදු කරන අතර මෙම පූජාවෙන් පසු වල්ලි දේවාලයේ කපු මහතා විසින් තින්නෝරු රැගෙන බස්නායක නිලමේ වෙත යනු ලබයි. එම තින්නෝරු වලින් බස්නායක නිලමේ තම නළලෙහි තිලකය තබා ගන්නා අතර අධිකාරම්, ලේකම්වරු සහ ආලත්ති

අම්මාවරුන්ගේ නළලෙහි තිලක තබනු ලබන්නේ වල්ලි අම්මා දේවාලයේ කපු මහතා විසිනි.

### 3.2 ඉල්මහ මංගල්‍යය පුද පූජා සහ චාරිත්‍ර සිදු කරන කපු පරම්පරා

රුහුණු මහා කතරගම දේවාලයේ අතීතයේ සිට වර්තමානය තෙක් ම නිල රාජකාරි සිදු වන්නේ විධිමත් සැලැසුමක් අනුව ය. මෙහි දී කතරගම දෙවියන් උදෙසා සිදු කරනු ලබන සියලු චාරිත්‍ර, වාර්ෂික ව සිදු කරනු ලබන පෙරහැර මංගල්‍යය ආදී සියලු රජකාරි මෙම නිල රාජකාරි මණ්ඩලය මඟින් සිදු කෙරේ. එනම් දේවාලය සම්බන්ධ සෑම කාර්යයක් සඳහා ම නිල කරනු ලැබූ කාර්ය මණ්ඩලයක් අතීතයේ සිට සාම්ප්‍රදායික ව වෙන් ව ඇත. මෙසේ වෙන් කර ඇත්තේ රාජ නියෝගයෙන් බව කාර්ය මණ්ඩලයේ විශ්වාසය යි. මේ පිළිබඳ කරුණු රැසක් අඩංගු ලේඛනයක් මහා දේවාලය සතු ව ඇති අතර එය ශ්‍රී බුද්ධ වර්ෂ 1658 දී රන් තහඩුවක ලියන ලද්දකි. එම රාජකාරි වර්තමානයේ පවා ක්‍රියාත්මක වන බව නිල නාමකරණය මගින් පැහැදිලි වේ. රාජකාරි මණ්ඩපයේ දහඅට දෙනාගේ කාර්යභාරය වන්නේ පුද පූජා සහ තේවා කටයුතුවල දී අවශ්‍ය වන සියලු පසුබිම් සකසා දීම හා ඒ ආශ්‍රිත රාජකාරි සිදු කිරීම යි. පහත දැක්වෙන්නේ දහඅට දෙනකුගෙන් යුත් රාජකාරි මණ්ඩපයේ සංයුතිය යි.

**වගු අංක 01.** කතරගම දේවාලයේ රාජකාරි මණ්ඩපය

| නිල නාමකරණය | සංඛ්‍යාව |
|---|---|
| ගොටුමහන්නන් | 04 |
| දවුල්කාර මුහන්දිරම්වරුන් | 04 |
| හක් පිඹින්නන් | 02 |
| හොරණෑ පිඹින්නන් | 02 |
| පාවඩකරුවන් | 02 |
| උඩුවියන්කරුවන් | 02 |
| මුහන්දිරම් පන්දම්කරුවන් | 02 |

(ක්ෂේත්‍ර අධ්‍යයනය, 2023)

මොවුන් සඳහා එක් එක් නිලනාමයන්ට අදාළ ව රාජකාරි පවරා ඇත. එනම් දවුල්කාර මුහන්දිරම් නිලධාරියා සියලු මුරුතැන් චාරිත්‍රවල දී නානුමුර මංගල්‍යයේ දී මෙන් ම මිණිබැඳි මණ්ඩපයේ දී දවුල් වැයීම ද දිය කපන විට පෙරහැරට පෙර තුන් විටක් දවුල හන් කිරීම ද සෑම පෙරහැර ආරම්භයක දී ම තුන්විටක් දවුල හන් කිරීම ද පෙරහැරේ හේවිසි වැයීම ද සිදු කළ යුතු ය. හක් නිලය, මුරුතැන් පූජාවේ දී හක් පිඹීම ද දෙවියන් වැඩීමේ දී හක් පිඹීම ද සිදු කරයි. හොරණෑ නිලය පෙරහැරේ හොරණෑව පිඹීම ද සෑම මුරුතැන් පූජාවක දී හොරණෑවක දී හොරණෑව පිඹීම සිදු කරයි. පාවඩ නිලය, දෙවියන් වැඩමවීමේ දී හා මුරුතැන් කඳ ගෙන ඒමේ දී මණ්ඩපයේ සිට අතුපන්දල දක්වා පාවඩ එළීම සිදු කරන අතර උඩුවියන් නිලය, මුරුතැන් කඳ ගෙන ඒමේ දී උඩුවියන් ඇල්ලීම ද, මුහන්දිරම් පන්දම් නිලය දවුලුකාර මුහම්දිරමට පෙරහැරේ දී පන්දම ඇල්ලීම සිදු කිරීම ද යනාදි වශයෙන් මෙලෙස සියලු නිලයන්ට අදාළ ව රාජකාරි වර්ගීකරණය වේ.

ඉල්මහ මංගල්‍යය පුද පූජා සහ චාරිත්‍ර පිළිබඳ අධ්‍යයනයේ දී දේවාලයෙහි රාජකාරි සිදු කරන කපු පරම්පරා ඉතා වැදගත් ය. දේවාලයක කපුවෙකුගේ කාර්ය භාරය වනුයේ දේව මෙහෙය පැවැත්වීම ය. ඔහු අනුමැති රාළ වශයෙන් ද හැඳින් වෙයි. ඔහුගේ කාර්යයන් අතර මුරුතැන් බෑම, බැතිමතුන්ගේ පූජා වට්ටි දෙවියන්ට කැප කිරීම. පැන් දීම, පරහඳ දීම හා දේවාශීර්වාදය ලබා දීම ප්‍රධාන වෙයි. මෙය හින්දු කෝවිලක ප්‍රධාන ස්වාමිතුමන්ගේ කාර්යභාරය හා සමාන වන්නකි. කපුරාළ තනතුර දැරීම සඳහා සුදුසුකම් කිහිපයක් සැපිරිය යුතු ය. ඒ අතර බෞද්ධයකු වීම, කතරගම දෙවොලට සම්බන්ධ කපු පරපුරකින් පැවත ඒම, සෞඛ්‍ය සම්පන්න වීම, මනා පෞරුෂයකින් හා ප්‍රියමනාප බවෙන් යුක්ත වීම, ප්‍රාමාණික අධ්‍යාපනයක් ලබා තිබීම, කථිකත්වයකින් යුතු වීම හා දුසිරිත්වලින් වැළැකීම ආදිය මේ තනතුර සඳහා අතිශයින් සම්පූර්ණ විය යුතු ගුණධර්ම හා යෝග්‍යතා ය (රණසිංහ, 2011). කතරගම දේවාලයේ කපුරාළ තනතුර දරන්නා බෞද්ධයකු විය යුතු යැයි වන නියමය සුවිශේෂී කාරණාවකි. සාම්ප්‍රදානුකූල ව දවසේ තේවාව සිදු කිරීම, අවුරුදු මංගල්‍යය, ඉල්මහ මංගල්‍යය, කප් සිටුවීමේ මංගල්‍යය, ඇසළ උත්සවය යන උත්සවයන්ට අදාළ චාරිත්‍ර හා පුද පූජා සිදු කිරීම, නැකැත් චාරිත්‍ර අනුව වත බැඳීම, නානුමුරය සිදු කිරීම වැනි කාර්ය සිදු කිරීම කපු මහතුන්ගේ රාජකාරිවලට අයත් වේ. වර්තමානයේ රාජකාරි සිදු කරන කපු පරම්පරා හතරක් සිටිය ද සක්‍රීය ව කටයුතු කරනු ලබන්නේ පරම්පරා ත්‍රිත්වයක් පමණි. රත්නායක පරම්පරාව, ගබඩාව භාර මුණසිංහ පරම්පරාව, ආරාපක්ෂ පරම්පරාව එම සක්‍රීය පරම්පරා ත්‍රිත්වය වන අතර නීතිමය හේතු නිසාවෙන් අධිකාරම් පරම්පරාව රාජකාරි සඳහා සහභාගි නොවේ.

රුහුණු මහා කතරගම දේවාලයේ කපු මණ්ඩලය කුඩා බෙත්මේ සහ මහ බෙත්මේ ලෙස කොටස් ද්විත්වයකින් යුක්ත ය. බෙත්මේ යනුවෙන් අදහස් වන්නේ 'පාලන කටයුතු සිදු කිරීම' යන්න යි. බස්නායක නිලමේ ප්‍රමුඛ පිරිස මහ බෙත්මේ පාර්ශ්වයට අයත් වන අතර මොවුන් පෙරහැරේ ගමන් කිරීමේ දී පෙරහැරේ ගමන් කරන ඇතාගේ දකුණු පසින් ගමන් කරන අතර කුඩා බෙත්මේ පාර්ශ්වය ඇතාගේ වම් පසින් ගමන් කරයි. කුඩා බෙත්මේ පාර්ශ්වයට අයත් වන්නේ අධිකාරම් නිලමේ ඇතුළු පිරිස යි. බස්නායක නිලමේ මඟින් කපු මණ්ඩලය හා පාලන කටයුතු පාලනය වන අතර අධිකාරම් නිලමේ මඟින් පෙරහැර කාර්යය මණ්ඩලය හා නිල රාජකාරි මඩුල්ල කළමනාකරණය වේ. වර්තමානයේ වුව ද මෙම නිලතලවලින් නියෝජනය වන්නේ දුටුගැමුණු හා සද්ධාතිස්ස පාර්ශ්ව යි. මහ බෙත්මේ හෙවත් බස්නායක නිලමේ පෙනී සිටිනුයේ දුටුගැමුණු පාර්ශ්වය වෙන්වෙනි.

කුඩා බෙත්මේ සද්ධාතිස්ස පාර්ශ්වය වෙනුවෙනි (රණසිංහ, 2011).

එමෙන් ම වර්ෂ 1870 අංක 4 ආඥා පනතට අදාළ ව ප්‍රවේණි පංගු සහ සිදු විය යුතු රාජකාරි අනුව රුහුණු මහ කතරගම දේවාලයේ ප්‍රවේණි නිල පංගු සහ කාර්යභාරය පන්සිය පනස් පහක් අතීතයේ පැවත ඇති අතර වර්තමානයේ පවතින්නේ එකසිය පනස් අටක් පමණක් බව සුමිත් රණසිංහ කතරගම් පුවත සාහිත්‍යය කෘතියේ පෙන්වා දී ඇත (රණසිංහ, 2011). එනම් බෙරකාර ගෙදර වත්තෙ නිල පංගුව (බදුලු පළාත බුත්තල කෝරළේ) කැරගොල්ල ප්‍රදේශයේ පදිංචිව සිටින අතර ප්‍රවේණි නිලකාර නාමය වන්නේ ගල්ගොඩ බෙරකාර වත්තේ සිරි යන්න යි. ඔහුගේ රාජකාරිය වන්නේ කතරගම පෙරහැරේ හේවිසි වාදනය කිරීම, කට්ටඩිගෙදර වත්තේ නිල පංගුවට අයත් ප්‍රවේණි නිලකාරයාගේ නාමය වන්නේ කට්ටඩි ගෙදර රංකිරියා ය. ඔහුගේ රාජකාරිය වන්නේ බස්නායක නිලමේ ගමට පැමිණෙන විට හේවිසියට යෑම යි. මෙලෙස ප්‍රවේණි පංගු සහ නිල රාජකාරි පංගු එකසිය පනස් අටක් පුරා බෙදී ගොස් ඇත.

උක්ත සඳහන් වූ අයුරින් රුහුණු මහා කතරගම දේවාලයේ ඉල්මහ මංගල්‍යයේ පුද සිරිත් සිදු වන අතර ඒවා රුහුණු මහා කතරගම දේවාලයට ම ආවේණික වේ.

## 4. නිගමන සහ නිර්දේශ

කතරගම දේව වන්දනය ලාංකේය සමාජයෙහි වඩාත් ප්‍රචලිත ආගමික සංකල්පයකි. ලාංකේය හින්දු මෙන් ම බෞද්ධ ජනයා ද මුරුගන්, ශන්මුගම්, සුබ්‍රමනියම්, කාර්තිකේය වැනි විවිධ නම්වලින් හඳුන්වන කතරගම දේව වන්දනය සිදු කරන අතර ඒ සඳහා දමිළ ජනයාට ම වෙන් වූ කෝවිල් රැසක් ද ලංකාව පුරා ඇත. එසේ ම බෞද්ධ ජනයා විසින් ද කතරගම දෙවි පුද ලබන අතර බෞද්ධ විහාරස්ථාන අභ්‍යන්තරයෙහි මෙන් ම ඉන් පිටත ද කතරගම දේවාලය තනා සිංහල බෞද්ධයෝ කතරගම දෙවි පුදති. රුහුණු කතරගම මහා දේවාලය මෙම දේවාල අතුරින් විශේෂ වන්නේ එය සිංහල මෙන් ම දමිළ ජනයා ද ඇතැම් විට මුස්ලිම් ජනයාගේ ද වන්දනයට පාත්‍රවන ආගමික පුද බිමක් වීම හේතුවෙනි. කතරගම පුදබිම දෛනික ව මහත් ජනාකීර්ණ වූ පුද බිමකි. දිවයිනේ වෙනත් ආගමික සිද්ධස්ථානවලට සාපේක්ෂ ව දෛනික පූජා සඳහා ද අතිවිශාල බැතිමතුන් පිරිසකගේ සහභාගීත්වය පවතින අතර වාර්ෂික පූජා සඳහා දිවයිනේ නන් දෙසින් මෙන් ම භාරතීය වාසීන්ගේ ද සහභාගීත්වය දැක ගත හැක.

කතරගම වාර්ෂික උත්සව අතර ඉල්මහ මංගල්‍යයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. කතරගම ඇසළ පෙරහැර බොහෝ වාර්තාවනට මූලාශ්‍රය වුවත් කතරගම පුද බිමේ වල්ලි අම්මා දේවාලයේ පහන් ආලෝක දල්වමින් සිදු කරන ඉල්මහ මංගල්‍යය ද ඇසළ උත්සවය සේ ම වැදගත් වන්නකි. එහි දී කතරගම මහා දේවාලයේ පෙරහැර ආරම්භයේ දී වල්ලි දේවාලයේ පහන් දල්වා කතරගම දෙවියන්ට ආසිරි පැතීම විශේෂත්වයකි. මෙම පහන් ආලෝක දැල්වීම ඉන්දියානු ජන සමාජයේ කතරගම දෙවියන් උදෙසා සිදුවන්නක් වන අතර ඉන්දියානු සම්ප්‍රදාය සිහිගන්වමින් මෙම චාරිත්‍රය තේවානි අම්මා දේවාලයේ ද සිදු කිරීම විශේෂිත ය. නැකැත් චාරිත්‍ර අනුව එක් දිනක් සිදු කරන ඉල්මහ පෙරහැර මංගල්‍යය කතරගමට ම ආවේණික ව පවත්වන්නකි. කතරගම දෙවියන් වෙනුවෙන් පවත්වන ඉල්මහ මංගල්‍යය සඳහා වීථි පෙරහැරක් පවත්වන එක ම ස්ථානය ද කතරගම පුද බිම පමණකි. එම පෙරහැර ද ඊට ම අනන්‍ය වූ ලක්ෂණවලින් සමන්විත වීම කතරගම ඉල්මහ මංගල්‍යය සංස්කෘතික වශයෙන් වැදගත් වීමට හේතු වේ.

කතරගම පුද බිම ආශ්‍රිත ව එක් වර්ෂයකට පෙරහැර මංගල්‍ය ත්‍රිත්වයක් සිදු කරන අතර වර්ෂ අවසාන පෙරහැර මංගල්‍යය වන්නේ ඉල්මහ කාර්තික උත්සවය යි. මෙය අතීතයේ සිට පැවත එන පාරම්පරික චාරිත්‍ර හා බැඳී පවතී. මෙම අධ්‍යයනයේ දී කතරගම පෙරහැර සංස්කෘතිය සඳහා පොදු වූ චාරිත්‍ර මෙන් ම ඉල්මහ මංගල්‍යය සඳහා සුවිශේෂ වූ පුද සිරිත් ද අනාවරණය විය. පොරොන්දු පඩි ලබා දී ඊළඟ වසරට රාජකාරි මණ්ඩපය නිලධාරීන් පත් වීමෙන් පසු ඔවුන් සිදු කරන පළමු මංගල්‍යය වීම මෙහි විශේෂත්වයකි. එහි දී කතරගම දේවාලයට අයත් දිරාපත් ද්‍රව්‍ය දිය මුදුන් තොටින් පා කිරීම සිදු කරයි. එසේ ම කාර්තික මංගල්‍යයේ දී සියලු පුද පූජා කපුමහතුන් විසින් මාසික ව බෙදීමක් යටතේ එනම් රාජකාරි මාස් පතා බෙදා වෙන්කර ගැනීමෙන් ආවේණික සිරිත් හා පාරම්පරික ව නීති රීති යටතේ සිදු කරන බව ද අනාවණය විය. එහි දී නැකැත් චාරිත්‍ර මූලික වේ.

විශේෂයෙන් ඉල්මහ මංගල්‍යයේ දී ජ්‍යොතිෂයේ එන 'කැති' නැකත ප්‍රධාන වන අතර දෙවියන් වැඩම වීම සඳහා මෙම නැකැත් හෝරාව භාවිත කෙරේ. එහි දී 'කැති' නැකත උදාවන තෙක් දෙවියන් දෙවොලෙන් පිටතට වැඩම වීම සිදු නොකෙරේ. එසේ ම මෙම කැති නැකත පූර්ණ විය යුත්තේ ද පොහොය දිනය මූලික කර ගනිමින් වන අතර රුහුණු මහා කතරගම දේවාලයේ වෙනත් කිසිදු පෙරහැර මංගල්‍යයක භාවිත නොවන චාරිත්‍රයකි.

දහඅට දෙනකුගෙන් සමන්විත වන රාජකාරි මණ්ඩපයක් විසින් සාම්ප්‍රදායික ව පවත්වා ගෙන ආ චාරිත්‍රවාරිත්‍ර වර්තමානයේ පවා අඛණ්ඩ ව පවත්වා ගෙන යනු ලැබේ. ගොටුමහන නිලය, දවුල්කාර මුහන්දිරම් නිලය, හක් නිලය, හොරණෑ නිලය, පාවඩ නිලය, උඩුවියන් නිලය, නැටුම් නිලය, පිරිත් නිලය, අධිකාරම් නිලය, කත් නිලය, හේනේ පංගුව හෙවත් පේඩි නිලය ආදී වශයෙන් එක් එක් පරම්පරා සඳහා සුවිශේෂ කාර්යභාර රැසක් එක් එක් අය විසින් සිදු කරනු ලබයි. කතරගම පෙරහැර මංගල්‍යයන්හි දී

බස්නායක නිලමේ ගමන් කිරීම අනිවාර්ය රාජකාරියක් වුව ද ඉල්මහ මංගල්‍යය පෙරහැර මංගල්‍යය සඳහා බස්නායක නිලමේ පෙරහැරේ ගමන් කිරීම අනිවාර්ය රාජකාරියක් නොවීම ද විශේෂතාවයකි.

වල්ලි අම්මා දේවාලය සහ තේවානි අම්මා දේවාලය හා බැඳුණු වත් පිළිවෙත් කතරගම ඉල්මහ මංගල්‍යය වඩාත් විශේෂ කිරීමට හේතු වෙයි. වල්ලි අම්මා දෙවොලෙහි චාරිත්‍ර දේශීය වාදන සම්ප්‍රදායට අනුව සිදුවන අතර හා තේවානි අම්මා දෙවොලෙහි චාරිත්‍ර ඉන්දියානු වාද්‍ය සම්ප්‍රදාය අනුව සිදු වන බව ද අනාවරණය විය. එසේ ම පෙරහැර වීථි සංචාරයේ දී නඩත්තු පද 32 වාදනය නොවීම ද ඉල්මහ පෙරහැරේ දැකිය හැකි විශේෂත්වයකි. ඇසළ පෙරහැර මංගල්‍යයේ දී මඟුල් වීථිය, පිට වීථිය ආදී ලෙස විවිධ වීථි ඔස්සේ ගමන් කිරීමේ දී නඩත්තු පද 32 වාදනය කෙරේ. නමුත් ඉල්මහ මංගල්‍යයේ දී මඟුල් වීථියේ පමණක් පෙරහැර ගමන් ගන්නා අතර එහි දී කෙටි නඩත්තු පද වාදනය ද මෙම පෙරහැරේ පවතින විශේෂතාවයකි.

ඉල්මහ මංගල්‍යයේ පෙරහැර චාරිත්‍ර වාරිත්‍ර මෙන් ම ඒ හා බැඳුණු වල්ලි හා තේවානි අම්මා දේවාල පුද පූජා චාරිත්‍ර කතරගම ඉල්මහ මංගල්‍යයට ම සුවිශේෂ ලක්ෂණ ප්‍රකට කරමින් ආගමික සහජීවනයක් විශද කරවයි. ඉල්මහ පෙරහැර කතරගම අනෙක් මංගල්‍ය මෙන් වැදගත් වූ සුවිශේෂ චාරිත්‍ර සහිත උත්සවයකි. ඇසළ පෙරහැරෙහි සිදු කෙරෙන බොහෝ පුද පූජා චාරිත්‍ර මෙම පෙරහැරට ද අනුගත කොට ඇත්තේ එය ආගමික වශයෙන් මෙන් ම සමාජීය වශයෙන් ද සුවිශේෂ මංගල්‍යයක් වන හෙයිනි. රුහුණු කතරගම පුද බිම හා සම්බන්ධ අනෙකුත් උත්සව මෙන් සමාජීය අවධානය ඉල්මහ මංගල්‍යය කෙරේ යොමු නොවී ඇති බව අධ්‍යයනයේ දී අනාවරණය විය. ඉල්මහ මංගල්‍යය ශ්‍රී ලංකාවේ ආගමික සහජීවන පිළිබඳ කාලීන සාක්ෂියක් වන අතර අස්පර්ශනීය සංස්කෘතික උරුමයක් ලෙස සමාජීය අවධානය ලබා දිය යුතු වැදගත් ආගමික උත්සවයක් ද වන්නේ ය.

**පිළිගැනීම:** මෙම පර්යේෂණයට දත්ත ලබා ගැනීමේ දී දායකත්වය ලබාදුන් රුහුණු මහා කතරගම දේවාලයේ තේවාව බාර කපු මහතුන්, ආලත්ති අම්මාවරුන්, දේවාලයේ රාජකාරි සිදු කරන නිලධාරීන්ට හා සියලු සම්පත්දායකයින්ට ස්තුතිය පිරිනමනු ලැබේ.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


අල්විස්, පී. (2009). *නොක්ස් දුටු ලංකාව.* සූරිය ප්‍රකාශකයෝ.

ආටිගල, ඒ. (2015). *පෙරහර විත්ති.* හෙළදිව ප්‍රකාශකයෝ.

දේවප්‍රිය, එස්. (2021). 1907 ඇසළ උත්සවය පිළිබඳ සටහන් ලිපිය. *සුරිඳුනි කතරගම.* ඇම්. ජී එච් ප්‍රින්ටින්. 53-57.

දේවප්‍රිය, කේ. ඩී. (2015). *දුටු නොදුටු කතරගම දෙවිඳු.* සූරිය ප්‍රකාශකයෝ.

ධර්මදාස, කේ. එන්. ඕ., තුන්දෙණිය, එච්. එම්. එස්. (1994). *සිංහල දේව පුරාණය.* රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

ප්‍රනාන්දු, ඩබ්. එල්. (2005). *කතරගම සහ එහි උත්සව* (1819-1839). සූරිය ප්‍රකාශකයෝ.

ප්‍රනාන්දු, ආර්. පී. (2017). *හින්දු දේව පුරාණය.* සමන්ති පොත් ප්‍රකාශකයෝ.

ප්‍රේමානන්ද හිමි, පී. (2000). *කතරගම.* බොඩගම ආර්. ඩබ්. ආර්. විජේනායක.

මාලිමගේ, ඒ. (2000). *කතරගම දෙයියෝ.* රත්න පොත් ප්‍රකාශකයෝ.

බණ්ඩා, සුමනසේකර. ස.ජ. (1993). *කඳ කුමර සිරිත.* රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

රණවීර, ඩබ්. වී. පී එච්. (2020). ශිව දේව වන්දනය හා බැඳුණු නූතන සමාජ ආකල්පඃ ශ්‍රී ලංකාවේ තෝරාගත් ප්‍රධාන ශිව දේවාලය කිහිපයක් ආශ්‍රිත අධ්‍යයනයක්, *මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ සඟරාව*, (වෙළුම 09, කලාපය 02). රුහුණු විශ්වවිද්‍යාලය. 1-26පිටු

රණසිංහ, එස්. (2011). *කතරගම් පුවත.* මධ්‍යම සංස්කෘතික අරමුදල.

රත්නපාල, එන්. (1995). ජනශ්‍රැති විද්‍යාව. සී/ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

වික්‍රමගමගේ, සී. (1997). *කතරගම හා කතරගම දෙවිඳු.* සීමාසහිත දීපානි මුද්‍රණ/ප්‍රකාශන.

සිල්වා, එච්. ජේ ද. (2023). *රුහුණු කතරගම දෙවියෝ.* සී/ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

සෝමරත්න, ඒ. එච්. එම්. (2017). *ඩේවි දුටු ලංකාව.* විසිදුනු ප්‍රකාශකයෝ.

සෝරත හිමි, ඒ. (2009). *කතරගම පුද සිරිත්.* සී/ස සරසවි ප්‍රකාශකයෝ.

Bhaktha, R., & Chennai, S. (n.d.). *Karthigai DeepamK Sriram.* https://achalamorg.wordpress.com/wp

content/uploads/2016/06/karthigaideepamwcover.pdf

Clothey, F. (2005). Murukan in Early South. in The many Face of Murukan. *The History and Meaning of a South Indian God.* Munshiram Manoharlal Pvt.

Ethnic Tanjore Arts - Tanjore Paintings. (2024). Ethnictanjorearts.com. https://www.ethnictanjorearts.com/karthigai-deepam-2024-celebrating-the-festival-of-lights-and-spiritual-radiance/

Kulendiren, P. (2012). *Hinduism a Scientific Religion: & Some Temples in Sri Lanka.* Universe, Inc

Obeyesekere, G. (1984). *The Cult of Goddess Pattini*. The University of Chicago.

Saparamadu, S. D. (2004). *The Esala Festivels from the Government Agents Diaries* 1852-1937.

Sastry Kapali, T.V, Madhav, Pandit Pundalik. (1997). *Translation of The Rigveda Samhita*, Vol 1, Sri Aurobindo Ashram.

Sircar, D.C. (2001). *The Deccan after the Satavahanas in The History and Culure of the indian People. The age of Imperial Unity*, 7th ed, Vol 2, Bharatiya Vidya Bhavam.

The Significance and Traditions of Karthigai Deepam Festival in South India. (2022). https://lakshmistores.com/blogs/news/the-significance-and-traditions-of-karthigai-deepam-festival-in-south-india?srsltid=AfmBOoqI-RQrp9_0J_cKGSIz2TKWjnRl7tFE1i_liCSaESQcAEYUJ5Yd

*The Śiva-purāṇa,* Part 2 of 4. (J. L. Shastri, Ed.). (1950). Motilal Banarsidas. In Internet Archive. https://archive.org/details/SivaPuranaJ.L.ShastriPart2/page/n5/mode/2up

*The Śkanda-purāṇa,* Part 1 (J. L. Shastri;G.P.Batt Ed.). (1950). Motilal Banarsidas. In Internet Archive. https://archive.org/details/SivaPuranaJ.L.ShastriPart2/page/n5/mode/2up